2021 ජනවාරි
03 කාණ්ඩය 07 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®

සටන් කරන තාරුණ්‍යයට






# මරණයටත් මිලක් හිමි කළක්!

ජීවත් වෙන්න මොතරම් දත කන මිනිස්සුද අපි? බත් කටක් කන්න කොච්චර නැහෙනවද? කොච්චර දත කනවද? මේ ඔක්කොම ජීවත් වෙන්න තියෙන ආශාවටයි, ජීවත් වෙන්න තියෙන බලාපොරොත්තුව වෙනුවෙනුයි. අපව විනාශ කරන්න වෛරසයක් ආවාම දවස් ගණන් නිදි මරලා, හරියට කන්නෙ බොන්නෙත් නැතිව වෛරසය විනාශ කරන්න පුළුවන් එන්නතක්, බෙහෙතක් හොයාගන්න කොච්චර මහන්සි වෙනවද? ඒ අපිට මැරෙන්නෙ නැතිව ජීවත් වෙන්න ඕනා නිසායි.

ඒත් එහෙම ලෝකෙක මිනිහෙක්ට ස්මාර්ට් විදිහට සල්ලි දීලා මැරෙන්න ක්‍රමයක් හැදුවොත් මොකක් වෙයිද? එතකොට අර ජීවත් වෙන්න ගත්ත මහන්සිය, කැපකිරීමට හිමිවෙන්නේ කොහොම තැනක්ද? ඒ කොහොම වෙතත් දැන් නම් ස්මාර්ට් විදිහට මැරෙන්න ක්‍රමය හදලා ඉවරයි. ස්විට්සර්ලන්තයේ මිනිස්සුන්ට මැරෙන්න පුළුවන් යන්ත්‍රයක් හදලා. කිසි ප්‍රශ්නයක් නැතුව දැන් ඉතින් සල්ලි ගෙවලා එයාලට කැමති තැනකට ගිහින් මැරෙන්න පුළුවන්.

අපි මවගේ කුසයේ පිළිසිඳ ගත්ත පළමු තත්පරයේ ඉඳන් හැමදේටම මිලක් නියම කරලයි තියෙන්නේ. මැරෙන එකට විතරයි මෙච්චර කාලෙකට මිල නියම කරන්න බැරි වුනේ. දැන් ඒ අඩුවත් සම්පූර්ණයි. එහෙත් මිනිස්සු නොමැරී ජීවත් වෙන්න ට්‍රයි කරද්දි මෙහෙන් මිනිස්සුන්ට මැරෙන්න ක්‍රමයක් හදලා දීලා. මොකද මේ ධනවාදයට ඕනේ මිනිස්සුන්ව ජීවත් කරවන්න නෙවෙයි. තමන්ට ලැබෙන ලාභය තව තවත් වැඩිකර ගන්න විතරයි. බලය, ධනය වෙනුවෙන් මානුෂීය හැඟීම් මරා දාලා, මැරෙන්න පවා මිලක් නියම කරන තැනට අද ධනවාදය සිය මුග්ධ දෑත් දිගහැරලා ඉවරයි. මේ තමයි ධනවාදයේ නිරුවත. මේ "සාර්කෝ (sarco)" යන්ත්‍රය කියලා කියන්නේ ඒ නිරුවතේ ප්‍රතිබිම්බයයි.



# ලාංකේය සංගීතයේ යුග යාත්‍රිකයා මාස්ටර් සර්

1937 වර්ෂයේ ජනවාරි 25 වාද්දුව තල්පිටියේ උපන් ගුරුගේ ප්‍රේමසිරි කේමදාස පෙරේරා එහෙමත් නැතිනම් ප්‍රේමසිරි කේමදාසයන් දහතුන් දෙනෙකුගෙන් යුත් පවුලේ බාලයායි. ඔහු ලාංකේය සංගීත ක්ෂේත්‍රයේ බිහි වූ අද්විතීයතම සංගීතඥයෙකි.

අතිශය දිළිඳු පවුලක ඉපිද පානදුර ශ්‍රී සුමංගල පිරිමි විද්‍යාලයෙන් සහ පානදුර ශාන්ත ජෝන් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ ඔහුගේ සංගීත චාරිකාවේ ආරම්භය සනිටුහන් වනුයේ බාල බටනලාවකිනි. ස්වයං අධ්‍යයනය තුළින් සංගීතය උගෙනීම ආරම්භ කළ ඔහුව රුහුණු විශ්වවිද්‍යාලය විසින් ගෞරව ආචාර්ය උපාධියකින් පුදනු ලැබීය. ඒ සංගීතයෙන් දේශපාලනය කළ මෙම වාමාංශික සංගීතඥයා විසින් කළ විප්ලවීය පෙරළිය හේතුවෙනි.


මෙරට සංගීත ක්ෂේත්‍රයේ නිම්වළලු පුළුල් කළ ඔහු නොබියව විවිධ සංගීත ශෛලීන් අත්හදා බැලීමේ ප්‍රතිඵලය වූයේ රසික හදවත් තුළ කේමදාස සලකුණ තදින් සනිටුහන් වීමය. බටහිර සම්භාව්‍ය සංගීතයේ අභාසය ලබමින්, එකිනෙකට නොගැළපෙන රිද්ම රටා හරි හරියට මුසුකරමින්, විප්ලවකාරී ප්‍රසංවාද (හාමනි), ඔපෙරාවන් බිහිකළ ඔහු ලාංකීය සංගීත ක්ෂේත්‍රය වෙනස්ම මානයකට රැගෙන ගියේය.

මොසාර්ට්, ගයිසෙෆ් වැනි බටහිර ඔපෙරා නිර්මාපකයන්ගේද ආභාසය ලැබූ කේමදාසයන් මෙරට සංගීත ඉතිහාසයේ ඔපෙරා විශේෂඥයා ලෙස හැඳින්වීමේ වරදක් නැත්තේය. ඔපෙරා සඳහාම ප්‍රසිද්ධ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි ඔපෙරා හවුස්හි පවා තම නිර්මාණයන් ඉදිරිපත් කිරීමට තරම් ඔහු භාග්‍යවන්ත විය.

රොඩී කෙල්ල චිත්‍රපටයෙන් සංගීත අධ්‍යක්ෂණයට පිවිසි ඔහු බඹරු ඇවිත්, නිධානය, ගොළු හදවත, අග්නිදාහය, හංස විලක්, තුන්වෙනි යාමය, පාර දිගේ ඇතුළු චිත්‍රපට හතළිහකට අධික සංඛ්‍යාවකට සංගීත අධ්‍යක්ෂණයෙන් සිය මධුරාලෝකය සැපයීය. එමෙන්ම ඔහු දඬුබස්නාමානය, වෙදහාමිනේ, අකාල සන්ධ්‍යා සහ අසල්වැසියෝ ඇතුළු ටෙලිනාට්‍ය ගණනාවක් හරහා ද ප්‍රේක්ෂක මනසේ මැකී නොයන මතකයන් සනිටුහන් කළේය.

එයින්ද නොනැවතී මෝරා, අත්, ධවල භීෂණ, මකරාක්ෂ වැනි වේදිකා නාට්‍ය ගණනාවක සංගීත අධ්‍යක්ෂණය කළ ඔහුගේ සුවිශේෂීතම සලකුණ වන්නේ ලාංකේය ඔපෙරා කලාවෙහි ඔහු විසින් දක්වන ලද අද්විතීයත්වයයි. මානසවිල, දොරමඬලාව, සොඳුරු වර්ණදාසි හා අග්නි ඔපෙරා මෙන්ම මුහුද, මාගේ කාලේ මවුනි හා සිංහල අවුරුද්ද යන සංධ්වනි යනු මේ යුග යාත්‍රිකයාගේ විශ්වීය සංගීතයේ දේශීය සන්නාමයන් වේ. එවැනිම තවත් එක් අග්‍රගණ්‍ය නිමැවුමක් වන්නේ එකම බෞද්ධ කැන්ටාටාව වන පිරිනිවන් මංගල්‍යයයි.

සංගීත ක්ෂේත්‍රයේ මේ අද්විතීය, මානවවාදී සංගීතඥයා අවස්ථා ගණනාවකදීම සරසවි, සුමති, ස්වර්ණ සංඛ, ජනාධිපති සහ OCIC සම්මානවලින් ගෞරවයට බඳුන් වුවද කිසිවිටෙකත් ඔහු රාජ්‍ය තනතුරු හෝ නම්බුනාම පිළි නොගත්තේය. "අඳුරු කුටිය" වැනි මෙරට වැඩ කරන ජනතාවගේ අධ්‍යාත්මය ස්පර්ශ කළ ගීතයන්හි සංගීත නිර්මාණය කළ ඔහුට සිය වාමාංශික අදහස් හේතුවෙන් 1971 දී සහ 1977 දී ගුවන් විදුලි භූමිය පවා තහනම් විය. එපමණකින් නොනැවතී ඔහුගේ නම ප්‍රචාරය වීම පවා තහනම් කළ ද කිසිවිටෙකත් ඔහු තම ජනතාවාදී සංගීත හඬ පාවා නොදීමට තරම් ධෛර්යමත් විය. 1982 දී සොල්දාදු උන්නැහේ චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය වෙනුවෙන් හිමි වූ ජනාධිපති සම්මානය පවා ඔහු ප්‍රතික්ෂේප කරන්නේ ද දේශපාලන හේතුවක් නිසාවෙනි. සංගීතය තම දේශපාලන මතවාදයේ ප්‍රකාශන මාධ්‍යය කරගත් මෙම අග්‍රගණ්‍ය මතවාදී සංගීතඥයා වර්ෂ 2008 ඔක්තෝම්බර් මස 24 වන දින තම දිවිසැරිය නිමා කළ ද ඔහු මෙරට සංගීත ක්ෂේත්‍රය තුළ කළ පෙරළිය කිසිදා නොනැසී පවතිනු ඇත.



# දේශපාලනයෙන් ඇත්වීම උත්තරයක් නෙවෙයි...

ජවිපෙ දේශපාලන මණ්ඩල සභික
සුනිල් හඳුන්නෙත්ති
සහෝදරයා සමඟ කළ සංවාදය ඇසුරෙනි...

### මේ දවස්වල සෑහෙන්න ප්‍රතිචාර නේද?

ඔව්! ඇත්තටම ඉතා ඉහළ ප්‍රතිචාර තියෙනවා. මේ පවතින ක්‍රමය නිසා මිනිස්සුන්ගේ ජීවන මට්ටම් පහත වැටිලා, ආර්ථිකය කඩා වැටිලා. පොදුවේ ගත්තහම ජනතාවටම අරමුණක්, බලාපොරොත්තුවක් නැති තත්වයට පත් වෙලා. අන්න ඒ නිසා දැන් සියලු දෙනාම එකතු වෙලා අරමුණක්, ඉලක්කයක් හොයනවා. තමන්ට නායකත්වය දිය හැකි නායකත්වයක් හොයනවා. විශේෂයෙන්ම ගෝඨාභය මහත්තයාගෙ ආණ්ඩුව බලයට ගෙනාපු ජනතාවට දැන් තමන්ගේ බලාපොරොත්තු බිඳිලා තිබෙන බව දැනිලා තියෙනවා. ඇත්තටම කිව්වොත් ඒ ජනතාවට තමන්ගේ රට ගැන අවංක බලාපොරොත්තු තිබුණා. ඒත් අද මේ පාලකයින් විසින් ඒ බලාපොරොත්තුවලට පයින් ගහලයි තියෙන්නේ. ඒ නිසා දැන් ජනතාව ලෑස්තියි, පාලකයින්ට පයින් ගහලා නැවත රැවටෙන්නෙ නැති නව පන්නයේ පාලනයක් බිහි කරගන්න. ඒ සඳහා ජනතාව විශාල වශයෙන් ඉතා කැමැත්තෙන් අප වටා එකතු වෙමින් ඉන්නවා. ඒ නිසායි මෙහෙම ඉහළ ප්‍රතිචාරයක් අපට ලැබෙමින් තියෙන්නේ.

### නමුත් අද රට මුහුණ පා තිබෙන මේ අභියෝගාත්මක තත්වය පිළිබඳව යම් වැටහීමක් තිබෙන සමහර පිරිස් දේශපාලනයෙන් ඈත් වීමේ හෝ රට හැරයාමේ ප්‍රවණතාවයකුත් තිබෙනවා නේද?

ඇත්තටම දේශපාලනයෙන් ඈත් වීම තේරුමක් නැති දෙයක්. මොකද හොඳ මිනිස්සු දේශපාලනය ගැන කලකිරුනට හොරු දේශපාලනය කරනවනේ. එතකොට වෙන්නේ නොදැනුවත්ව හෝ හොරුන්ට දේශපාලනය කරන්න ඉඩ දීමක්ම තමයි. ඒකෙන් මේ පවතින ක්‍රමය තවදුරටත් ඉදිරියට ගෙනියන්න තල්ලුවක් ලැබෙනවා මිසක් හොරුන්ට පාඩුවක් වෙන්නේ නැහැ. ඒ නිසා මේක උත්තරයක් නෙවෙයි. කොහොමත් සියල්ලම දේශපාලනිකයි. අපි හම්බ කළොත් අපි කනවා කියලා හිතුවට එහෙම කරන්න බැහැ. අපි හුස්ම ගන්න එකත් දේශපාලනීකරණය වෙලා.

අනික තමයි ඔබ අහපු දෙවැනි කාරණය. විශේෂයෙන්ම අද මේ රටේ තරුණ පිරිස් වැඩි වැඩියෙන් රට දාලා යන්න පෙළඹිලා ඉන්නවා. නමුත් මේක එහෙම ගිහිල්ලා තනි තනියෙන් ජීවිතේ ගොඩදාගන්න පුළුවන් ලෝකයක් නෙමෙයි. සිංදුවල, චිත්‍රපටවල තියෙනවා වගේ නෙවෙයි, රට යන අය දන්නවා තමන් අවුරුදු ගාණක් තිස්සෙ දුක් විඳින තරම්!. ඉතින් අපි ඒ අයගෙන් අහන්නේ, ඔබ ඒ විදියට අවුරුදු ගාණක් දුක් විඳලා මේ රටට ඇවිත් නැවතත් දුක් විඳින එක නවත්වන්න ඕනා නැද්ද? ඔබේ පවුල, දරුවො, දෙමව්පියො, නෑදෑයො, හිතවත්තු ඔක්කොම දුක්

> දැන් මේ රටටත් මුළු ලෝකයටමත් අවශ්‍ය වෙලා තියෙන්නේ සිස්ටම් චේන්ජ් එකක්. ඒ සඳහා අනිවාර්යයෙන්ම මේ තියෙන ධනවාදී සමාජ ක්‍රමය වෙනුවට සමාජවාදී සමාජ ක්‍රමයක් බිහිකළ යුතුමයි.

විඳින එක නවත්වන්න ඕන නැද්ද?

අපි අවුරුද්දක් දෙකක් මහන්සි වෙලා මේ දුෂ්ට පාලකයින්ව එළවලා දාමු. ඒක පිටරට ගිහින් දුක් විඳිනවට වඩා ලේසියි. එතකොට අපට පුළුවනි රටේ තියෙන සම්පත්වලින් මේ රට දියුණු කරලා මේක ණය ගන්න රටක් වෙනුවට ණය දෙන රටක් බවට පත් කරන්න. විශේෂයෙන්ම තරුණ ඔබේ ජීවිතයේ හොඳම කාලය පිටරටක දුක් විඳින්න වැය නොකර ඒ කාලය, ශ්‍රමය හා ශක්තිය යොදවලා අපි අපේ රට ගොඩනගමු. ඒ නිසා ඔබට පුළුවන්නම් තමන්ගෙ වටේ ඉන්න දහ පහළොස් දෙනෙක්ට මේ පණිවිඩය දෙන්න ඒකෙන් ලොකු වැඩක් කරන්න පුළුවන්.

### අද වෙනකොට අපි මුහුණ දීලා ඉන්න මේ ආර්ථික අර්බුදය මුළු ලෝකෙටම පොදු තත්වයක්ය කියන කාරණය නිතර කියවෙනවා. එහෙමනම් දැන් ඇත්තටම ෆේල් කවුද?

ඔව්! ඇත්තටම ඒක නිවැරදියි. මේක ලංකාවට විතරක් නෙවෙයි, මුළු ලෝකෙටම අදාළයි. දැන් එක පැත්තකින් ගත්තොත් අද මේ කතාව කියන්නේ කවුද? ලංකාව මේ ක්‍රමය ඇතුළෙම හදනවා, ගොඩදානවා කියපු මිනිස්සුමනේ. දැං එතකොට ඒ අයත් පිළිඅරගෙන ඉවරයි මේ ධනවාදී සමාජ ක්‍රමය කියලා කියන්නේ ලංකාවට විතරක් නෙවෙයි ලෝකෙටම අසාර්ථක ක්‍රමයක් බව. හැබැයි අපේ රටේ පාලකයින් නම් දඟලන්නේ මේ කතාව කියලා තමන්ගෙ තියෙන බැරි බැරියාව, වංචාව, දූෂණය හා නාස්තිය වහගන්න විතරයි.

රටේ නිෂ්පාදනය ඇනහිටලා. ආදායම් මාර්ග නැවතිලා. ජනතාවගේ ජීවන වියදම ඉහළ ගිහින්. ගොවියට පොහොර නැහැ. ගොවියට, ධීවරයට තමන්ගේ කර්මාන්ත පවත්වාගෙන යන්න දීපු සහන කපලා. නිෂ්පාදනය දිරිගන්වනවා වෙනුවට ඒවා සම්පූර්ණයෙන්ම ඇනහිටවන තත්වයට පත්කරවමින් ඉන්නවා.

ඒ නිසා ඇත්තටම ගත්තොත් දැන් මේ රටටත් මුළු ලෝකයටමත් අවශ්‍ය වෙලා තියෙන්නේ සිස්ටම් චේන්ජ් එකක්. ඒ සඳහා අනිවාර්යයෙන්ම මේ තියෙන ධනවාදී සමාජ ක්‍රමය වෙනුවට සමාජවාදී සමාජ ක්‍රමයක් බිහිකළ යුතුමයි. අන්න එතකොට කාටත් පුළුවනි සාමූහික ක්‍රියාවලියක් තුළ ලබන ජයග්‍රහණ වඩාත් සාධාරණ ක්‍රමයක් යටතේ බෙදාගන්න.

### ජේවීපී එකේ නායකත්වයෙන් රට ගොඩදාන්න පුළුවන් කියලා කොහොමද විශ්වාස කරන්නේ?

මෙහෙමයි. හැමෝම කරන්නම් කරන්නම් කියලා මිනිස්සුන්ව රවට්ටලා තියෙන නිසා අපිත් කරන්නම් කියලා කියන දේවල් ගැන හිතන්න එපා. නමුත් ආපස්සට හැරිලා අපේ භාවිතාවන් දෙස බලන්න. දූෂණය, වංචාව නතර කරනවා කියලා අපි කියනකොට අපේ අතීතය තුළිනුත් අපි ඒ ආදර්ශය රටට දීලා තියෙනවා.

කොයිතරම් තනතුරු දැරුවත් විනය කඩනවානම් ඒ අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්න අපේ පක්ෂය පැකිළිලා නෑ. ඒ වගේම ස්වේච්ඡාවෙන් වැඩකිරීම අතින් ගත්තත් අපි බොහෝ ආදර්ශ දීලා තියෙනවා. රට වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනා හැම අවස්ථාවකදිම අපේ පක්ෂයේ මන්ත්‍රීධූර, ඇමතිධූර විතරක් නෙවෙයි ජීවිත පවා කැපකරන්න අපි පසුබට වෙලා නැහැ. රටට එරෙහි දේශපාලන අනතුරුවලදි රට වෙනුවෙන් අපි හැමවිටම ඉදිරියට ඇවිත් තියෙනවා.

අනික තමයි අද වෙනකොට විවිධ අදහස් සහිත ජනකොටස්, පුද්ගලයින් සහ කණ්ඩායම් සමඟ රට ගොඩනැගීම වෙනුවෙන්, එක් අරමුණක් වෙනුවෙන් එක්ව කටයුතු කරන්න හැකි කණ්ඩායමක් ලෙස අප ජාතික ජනබලවේගය වටා එක්ව සිටිනවා. ඒ නිසා අපි කරන්නම් කියලා කටින් කියන දේට වඩා අපේ අතීත භාවිතාවන් ගැන සැලකිලිමත් වෙන්න, ඒ දේවල් දිහා බලලා අපව විනිශ්චය කරන්න කියලා අපි ජනතාවට කියනවා.

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# ලෙමන්වලින් ලෙමනේඩ් තැනීම...

"බල්ලා බැබිල ගහේ මළපහ කළා වගේ" කියා කියමනක් ඇත. දැන් දැන් මේ කියමන හොඳින්ම ගැළපෙන්නේ ගෝඨාභය මහත්තයාගේ ආණ්ඩුවටය.

එවැනි සිදුවීමක් පසුගිය මාසයේදීද සිදුවුණි. ඒ සමාජවාදී තරුණ සංගමය විසින් සුන්දර රටක් හදන්නට තාරුණ්‍යයට ආරාධනා කරමින්, එයට එක්වෙන ලෙසට සිය ෆේස්බුක් පිටුව හරහා පළකළ දැන්වීමක් සම්බන්ධයෙනි. තාරුණ්‍යයෙන් ඊට ලැබුණු ප්‍රතිචාර ඉතා ඉහළය. නමුත් රාජපක්ෂ මහතාගේ මඩ බලකායේ වියතුන්ට නම් මෙය දරාගත නොහැකි වූයේය. එබැවින් එය වැළැක්වීමට යැයි සිතා අරුම පුදුම ක්‍රියාමාර්ගයක් ගත්තේය.

පළමුව සිය මඩ බලකායේ කුලීකරුවන් යොදවා ඉහත කී පෝස්ටුව හරහා දිස්ත්‍රික් සම්බන්ධීකරණය සඳහා දුරකථන අංක සඳහන් කළ තරුණියන්ගේ phone numbers යොදාගෙන මඩ පෝස්ට් නිර්මාණය කළහ. "ආතල් එකට රවුමක් යන්න අපිත් එක්ක සම්බන්ධ වෙන්න" යැයි කියමින් එලෙස අශෝභන පෝස්ට් පළකර තිබුණි.

එහෙත් ධෛර්යවන්ත රැඩිකල් තරුණියෝ එයින් නොසැලී, රවුම් ගහන්නට හිතාගෙන තමන්ට ඇමතූ සියල්ලන්ටම JVP youth සමඟ සම්බන්ධ වීමේ අවශ්‍යතාවය ගැනත් රාජපක්ෂවරුන්ගේ තුච්ඡ දේශපාලනය ගැනත් පැහැදිලි කළහ. අවසානයේදී ට්‍රිප් යන්නට කතා කළ තරුණයින්ද රාජපක්ෂවරුන් කෙරෙහි තවදුරටත් කලකිරෙන්නට විය.

එයින්ද පාඩමක් නූගත් රාජපක්ෂ මඩබලකාය නැවතත් බැබිල ගහේ මළපහ කළේය. එවර දිස්ත්‍රික් සම්බන්ධීකරණයට යොදා තිබූ තරුණයින්ගේ phone numbers යොදාගෙන "ගෑස් සම්බන්ධයෙන් මතුවන ඕනෑම ගැටලුවක් පිළිබඳව කතා කරන්න" යැයි පවසමින් සමාජ ජාලයට බොරු පෝස්ටුවක් මුදාහැරීය. පීඩාවට පත්ව සිටි විවිධ ක්ෂේත්‍රවල නියුතු වෘත්තිකයින් මෙන්ම අසරණ ජනතාවද නොකඩවා දුරකථන ඇමතුම් ලබා දුන්හ. ඒ අනුව JVP Youth හි තරුණයෝද ඔවුන්ට රාජපක්ෂවරුන්ගේ ඇත්ත පහදා දෙමින්, ජනතාව දුකට පත්වූ විට පාලකයින් එය සමච්චලයට ලක් කරන්නේ කෙසේදැයි පැහැදිලි කළහ. පසුව ඔවුහු තමන්ට ලැබුණු මෙම දුරකථන ඇමතුම් පිළිබඳ තොරතුරු එකතු කොට පාරිභෝගික සේවා අධිකාරියට පැමිණිලි කළහ. එමඟින් ජනතාවගේ ගැටලු වෙනුවෙන් මැදිහත් වෙන්න යැයි පාලකයින්ට බලකර සිටීමට කදිම අවස්ථාවක් උදාකර ගත්හ.

අවසානයේ සිද්ධ වූයේ ආණ්ඩුවේ මඩකරියන් විසින් දමාගසන ලද ලෙමන් එකතු කරමින් JVP Youth කොල්ලො කෙල්ලො ලෙමනේඩ් හදාගත්තා වගේ වැඩකි.

**දෙසැම්බර් 20**

## බිඳවැටුණු මව්බිමට විසඳුම...



දෙසැම්බර් 20 මෙරට ප්‍රගතිශීලී ජනතාවට නව ඇරඹුමක දිනයක් බවට පත්වුණා. ඒ 'බිඳවැටුණු මව්බිමට විසඳුම' නමින් ජවිපෙ ප්‍රමුඛ ජාතික ජනබලවේගයේ නියෝජිත සමුළුව පැවැත්වීමත් සමඟයි. විද්වතුන්, කලාකරුවන්, වෘත්තීයවේදීන්, ආගමික නායකයින්, ආචාර්ය, මහාචාර්යවරුන්, වෘත්තීය සමිති නායකයින් ඇතුළු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර මොනාක් ඉම්පීරියල් ශාලාවේදී පැවැත්වුණ මේ සමුළුව රටේම අවධානයට ලක්වුණා. මෙහි ප්‍රධාන කතාව කළ ජාතික ජනබලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා පැවසූයේ, මේ රට ගොඩගැනීමට නම් සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය බවත්, එය දියසෙන් කුමාරවරුන්ට කළ නොහැකි බවත්, රට හැදීමට සිටින එකම බලවේගය ජාතික ජන බලවේගය ප්‍රමුඛ ප්‍රගතිශීලී සන්ධානය බවත්, ඒ සඳහා ඔවුන් සූදානම් බවත්ය.

**දෙසැම්බර් 21**

## පුතාගෙන් පටන්ගත් හූව බාප්පාටත්

ශ්‍රී ලංකා ප්‍රිමියර් ලීග් තරඟාවලියේ අවසන් තරඟය සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී පැවැත්වුණා. එහි පැමිණි ක්‍රීඩා ඇමති නාමල් රාජපක්ෂ මහතාට ක්‍රීඩාලෝලීන් විසින් හූ වර්ෂාවකින් සංග්‍රහ කරලා. ඔහු ක්‍රීඩා පිටියෙන් යනතුරුම නොනැවතුනු හූ හඬින් රැව්දුන්නේ 'දැන් සැපද?, දැන් සැපද?' කියායි. හූ හඬ එයින්ද නැවතුනේ නැහැ. ශෂේන්ද්‍ර රාජපක්ෂ ඇමතිතුමාට වගේම රාජගිරියේදී තවත් ඇමති කෙනෙකුටද හූ සංග්‍රහයක් ලැබුණායි කියලයි ආරංචි. එයින් නොනැවතුණ හූව පසුගියදා ජනාධිපති ගෝඨාභය මහතාටත් කන්න වුණා. මේ හූවලින් කියාපාන්නේ මොකක්ද? මෙය දූෂිත රාජපක්ෂ පාලනයට එරෙහිව නැගෙන විරෝධයේ එක් මුහුණුවරක් පමණයි. ආණ්ඩුව ජනතාව පීඩනයට ලක්කළාම ඒවා දරාගෙන ඉන්න එකෙත් සීමාවක් තියෙනවා. අවස්ථාවන්



ආවම පීඩනය මුදාහරිනවා. ඒක රාජපක්ෂ ආණ්ඩුව දැන්වත් අවබෝධ කරගත්තොත් හොඳයි කියලයි හිතෙන්නෙ.

**දෙසැම්බර් 25**

## කාදිනල් හිමිගේ විප්ලවීය වෙනස

කාදිනල් හිමිපාණන් විසින් නත්තල් දින පැවසූ කතාවක් බුකියේ එහා මෙහා ෂෙයාර් වෙන්න පටන්ගත්තා. "මේ රට යන විදිහ



හරියන්නෙ නැහැ. දැන් සමාජ පරිවර්තනයක් අවශ්‍යයි. අපේ සමාජය පිරිහිලා. අපේ රට දූෂණය වෙලා. පරිසරය විනාශ වෙලා. අපේ ලස්සන රට මුදල් වෙනුවෙන් වන්දි ගෙවනවා. මේක දැන් වියළි කතරක් බවට පත්වෙමින් යනවා. ඒ නිසා දැන් සියලුදෙනාම එක්වී මේක වෙනස් කරන්න ඕන. විප්ලවීය වෙනසක් අවශ්‍ය වෙනවා." ඇත්තටම සමාජ පරිවර්තනයක් අවශ්‍ය වෙන බවයි එතුමා පවසන්නේ. මේ යථාර්ථය සියලු ආගමික නායකින්, සියලු බුද්ධිමතුන් දකිනවා නම් රටට යහපත් අනාගතයක් උදාවේවී.

**දෙසැම්බර් 24**

## බස්ගාස්තු වැඩිකිරීමේ අයිතියත් බස් මුදලාලිටම

තෙල් මිල ඉහළයෑම නිසා ජනතාව විශාල වශයෙන් පීඩාවට පත්වෙලා. ඒ නිසා සියලු භාණ්ඩවල මිලත් වැඩිවෙමින් යනවා. ආණ්ඩුව භාණ්ඩ මිල වැඩිවීම්වලදි මැදිහත්වීමක්



නොකර සිටිනවා. ඒ නිසා දැන් ජනතාවට වට කිහිපයකින් බැටකන්නයි සිදුවෙලා තියෙන්නේ. ඒ අතරට දැන් බස්ගාස්තු වැඩිවීමක් ගැන කතාවෙනවා. බුකියේ පළවූ ආරංචිමාර්ග අනුව පැහැදිලි වෙන්නෙ බස්ගාස්තු පාලනය කිරීමත් ආණ්ඩුවට කරගන්න බැරි බවයි. බස්ගාස්තු වැඩිකිරීම බස් හිමියන්ටම කරගන්න කියලා අත පිහිදාගන්න ආණ්ඩුවක් මොකටදැයි බුකීවාසින් ප්‍රශ්න කරනවා. ඉතිං මෙහෙම යනකොට ජනතාවට සොරිම තමයි.

# වෙන් වෙන්ව ආහාර පරීක්ෂා කිරීම විසඳුමක් නොවේ!

ආචාර්ය අශෝක රංවල



### විෂ ආහාර ගැන පසුගිය කාලේ වැඩිපුර කතා කරා. ඇත්තටම මොනවද විෂ ආහාර කියන්නේ?

පෝෂණය කියන්නේ ජීවීන්ගේ ප්‍රධාන අවශ්‍යතාවයක්. ජීවීන් ශාක සහ සත්ත්ව ලෙස කොටස් දෙකකට වෙන් කළ හැකියි. ශාක තමන් අවට පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය වලින් තමන්ට අවශ්‍ය පෝෂක ද්‍රව්‍ය තමා තුළම නිපදවා ගන්නා අතර සතුන්ට එසේ හැකියාවක් නොමැති නිසා ඔවුන් ශාක කොටස් හෝ සත්ත්ව කොටස් මුඛය හරහා ලබාගෙන තමන්ට අවශ්‍ය පෝෂණය ලබා ගන්නවා. ශාක පත්‍ර වල ඇති පූටිකා සිදුරු මගින් වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් උරාගෙන කාබන් සහ ඔක්සිජන් ලබා ගන්නා අතර මුල් මගින් පසෙහි ඇති ජලය සහ නයිට්‍රේට මගින් නයිට්‍රජන් ලබා ගන්නවා. මූල වල සිදුවන රයිසොස්පියර් නමින් හඳුන්වන විශේෂ ක්‍රියාවලියක් මගින් පස් අංශු ජලය හා ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවලියන් මගින් ජීරණය කරලා කාබන් දාම බිඳහෙලමින් ශාකයට අවශ්‍ය නයිට්‍රජන්, පොටෑසියම්, පොස්පරස් වැනි මූලද්‍රව්‍ය උරා ගැනීම සිදු කරනවා.

නමුත් වර්තමානයේ පසට යොදන කෘමිනාශක, වල්නාශක, රසායනික පොහොර නිසා ශාකවල කිරි මුල් හානි වී දුර්වල වන නිසා මෙම රයිසොස්පියර් ක්‍රියාවලිය අඩපණ වෙනවා. ඒ නිසා පසෙහි ඇති විෂ රසායනික ද්‍රව්‍ය පෙරීමකින් තොරව ශාක වලට ඇතුල් වෙලා ශාක කොටස් වල තැන්පත් වෙලා ආහාර දාම ඔස්සේ මිනිසාගේ ශරීරයට ඇතුල් වනවා. එලෙස අපේ ශරීරයට අනවශ්‍ය අපේ නිරෝගීකමට බාධා වන ලෙස ශරීරයේ තැම්පත් වන දේවල් අපි විෂකාරක, විෂ ආහාර ලෙස හඳුන්වනු ලබනවා.

### ආහාර ප්‍රමිතිකරණය කියන්නේ මොකක් ද?

ආහාරයක් අපේ භාවිතයට සුදුසු ද නැද්ද කියලා තෝරා බේරා ගන්න සුවිශේෂී ක්‍රම ගණනාවක් විවිධ රටවල් භාවිතා කරනවා. එකක් තමයි ආහාර වෙන් වෙන් වශයෙන් ගෙන එහි යම් අපද්‍රව්‍යක් මිශ්‍රවීමක් මගින් ආහාර විෂ විය හැකි ද, එය භාවිතයට සුදුසු වන්නේ කුමන කාණ්ඩයට ද? එම වර්ගය මගින් පාරිභෝගිකයා රැවටීමකට ලක්විය හැකි ද කියලා සොයා බැලීම. එසේම සෞඛ්‍ය පැත්තෙන් යම් ආහාරයක අඩංගු බැර ලෝහ ප්‍රමාණය, නයිට්‍රේට් ප්‍රමාණය තවත් ඇතුළත් විය හැකි විෂ රසායනික ද්‍රව්‍ය පිළිබඳ තක්සේරු කිරීමත් ප්‍රමිතිකරණ ක්‍රමයක්. මෙම ක්‍රම නීත්‍යානුකූල කටයුතු, ආනයනික කටයුතු සඳහා ප්‍රමාණවත් වුවත් අප ආහාරයක් සපයා ගන්න ක්‍රමය අනුව මෙය වෙනස් වනවා.

### ලංකාවේ ප්‍රමිතිකරණය ගැන සෑහීමකට පත් විය හැකි ද?


කලින් සඳහන් කරා වගේ තනි තනි ආහාර වර්ග වල අඩංගුව පිලිබඳව අදහසක් ගැනීම මගින් වෙළඳ නීති, අණපණත් මගින් ආහාර ප්‍රමිතිකරණය ආනයනික නීති අණපනත් මගින් ආහාර ප්‍රමිතිකරණය කිරීම ආනයනික කටයුතු සඳහා වෙළඳාම සහ ප්‍රමාණවත් වුවත් එය 100% පාරිභෝගිකයා ආරක්ෂා කරන ක්‍රමවේදයක් නෙවෙයි. ඇත්තටම අපිට ගහක ගෙඩියේ දැක්කම ඒක ආහාරයට ගැනීමට, අපි ගෙවත්තේ වගා කර ගත් දෙයක් ආහාරයට ගැනීමේ දී අයිතිය තහවුරු විය යුතු ය. අපි හිතනවා අපි විසින් නිෂ්පාදනය කර ගන්නා ආහාර ගුණාත්මක බව. නමුත් පොළොවේ ඇති කුමන රසායන ද්‍රව්‍යයන් ඊට ඇතුලත් වෙලාද කියලා අප දැනුවත් නෑ. ඒ නිසා තනි තනියෙන් ආහාර වල ප්‍රමිතිය ගැන සෙවීමට වඩා වැදගත් දේ තමයි රටේ පරිසරයට, පසට, වායු ගෝලයට නිදහස් කරනු ලබන විෂ රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය අවම කර ගැනීමට සහ ක්‍රමානුකූල කර ගැනීමට උත්සාහ කිරීම. අපේ රටේ එවැනි ක්‍රමවේදයක් නැහැ.

### ඔබ දකින ආකාරයට විෂ ආහාර ප්‍රශ්නයට හොඳම විසඳුම කුමක් ද?

විෂ ආහාර වර්ග දෙකක් තියෙනවා. එකක් ක්ෂණිකව සිරුරට විෂ වී අප රෝගී කරන ආහාර. ඒවා ගැන වැඩි දුර කතා කළ යුතු නැහැ මොකද ඒවා පිළිබඳ අද වන විට මිනිසා දැනුවත් වීමක් තියෙන නිසා. අනෙක් වර්ගය තමයි දීර්ඝ කාලීනව අපේ ශරීරයේ තැම්පත් වෙලා අපේ නිරෝගිකමට හානි පමුණුවන, ආයු කාලය අඩු කරන ආහාර. එවැනි විෂ අපේ ශරීරයට ඇතුළු වන ප්‍රධාන ක්‍රමයක් තමයි ශාක ආහාර ගැනීම. ශාක කොටස් වල තැම්පත් වී ඇති විෂ රසායන ආහාර දාම ඔස්සේ අපේ ශරීරයට ඇතුළත් වී තැම්පත් වීම. එම නිසා ශාක වලට මෙම ද්‍රව්‍ය ඇතුළත් වීම වැළැක්විය යුතුයි. ඒ සඳහා රසායනික ද්‍රව්‍ය පස සමඟ මිශ්‍රවීමට අදාලව නිවැරදි විද්‍යාත්මක යාන්ත්‍රණයක් සැකසිය යුතුයි. රටේ ජනතාව, ආණ්ඩු එකතුව ඒ සම්බන්ධව රටේ ආරක්ෂාව තහවුරු කරන පුළුල් වැඩපිළිවෙළක් සැකසිය යුතුයි. එසේ නැතිව තනි තනිව ආහාර වල ප්‍රමිතිය ගැන සොයා බලන්න ගියොත් අපිට ආහාර සම්බන්ධව බරපතල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා.



# ධනේශ්වර ආර්ථිකය බංකොලොත්!



ගෑස් පෝලිම්, ගෑස් පිපිරීම්, කිරිපිටි පෝලිම්, සීනි පෝලිම්, පොහොර හිඟය, පිරිපහදුව වසා දැමීම, තෙල් මිල ඉහලයාම, භාණ්ඩ මිල දෛනිකව ඉහලයාම, සිමෙන්ති හිඟය, භාණ්ඩ ආනයන සීමා තවදුරටත් දීර්ඝ කිරීම, වරායේ බහාලුම් සිරවීම, රන් සංචිත අලෙවි කිරීම වැනි ජනතාව පීඩාවට පත් කරන සිදුවීම් පිළිබඳව අද අප රටේ දෛනිකව ඇසෙන්නට පටන්ගෙන ඇත. මේ සෑම මාතෘකාවකම මූලය රටේ ඇති මූල්‍ය අර්බුදය බවත්, එය දිගුකාලීනව පැවතිය හොත් රට ඉක්මණින්ම බංකොලොත්වීමට ඉඩකඩ වැඩි බවත් කෙතරම් පැවසුවද එය පිළිගැනීමට වත්මන් ධනේශ්වර පාලකයින් සූදානම් වූයේ නැත. නමුත් පසුගියදා ෆිච් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද නවතම ආර්ථික දත්ත අනුව මෙය තහවුරු විය.

මෙම ආයතනය විසින් ශ්‍රී ලංකාව දිගු කාලීන විදේශ විනිමය පියවීම පැහැරහැරීමේ අවදානමක පවතින බවට අනතුරු අඟවා ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල්(IDR) ශ්‍රේණිගත කිරීම 'CCC' සිට 'CC' දක්වා පහත හෙළීය. මෙම ආයතනයට අනුව ලංකාවේ විදේශ විනිමය සංචිත අගෝස්තු මාසයේ සිට ඩොලර් බිලියන 2කින් පමණ අඩු වී ඇති අතර, නොවැම්බර් අග වන විට එය ඩොලර් බිලියන 1.6 දක්වා පහත වැටී ඇත. මෙය 2020 අවසානයේ සිට ඩොලර් බිලියන 4ක පමණ විදේශ මුදල් සංචිතවල පහත වැටීමකි.

මේ අනුව විදෙස් සංචිත පහල වැටී ඇති බව පසුගියදා ආණ්ඩුවටම පිළිගැනීමට සිදුවිය. පසුගිය නොවැම්බර් මාසය වෙන විට රට සතුව තිබූ නිල සංචිත සහ වත්කම් ප්‍රමාණය ඩොලර් මිලියන 1587(බි.1.587)කි. මෙයින් ඩොලර් මිලියන 382.2ක් රත්රන් ලෙසද, විනිමය සංචිත ලෙස ඩොලර් මිලියන 1009.5ක් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තැන්පත්කර තිබෙන සංචිත ලෙස ඩොලර් මිලියන 67ක් මෙන්ම විශේෂ ගැණුම් හිමිකම් ඩොලර් මිලියන 127.2ක්ද තිබී ඇත. ඊට අමතරව අනෙකුත් විවිධ සංචිත ඩොලර් මිලියන 1.1කි.

මෙසේ විදෙස් සංචිත පහලයෑමක් පෙන්නුම් කළද 2022 වසරේදී ගෙවීමට ඇති ණයවල අඩුවක් වී නැත. 2022 ජනවාරි මාසයේදී ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර දෙකක් ගෙවිය යුතුය. 2022 ජූලි මාසයේදී ඩොලර් බිලියන 1ක් ගෙවිය යුතුය. මෙයද ඇතුලුව 2022 වසරේදී ඩොලර් බිලියන 6.9ක ණය වාරික සහ පොලී ඇතුළුව විදේශ මුදල් ණය සේවා ගෙවීමටද රජයට සිදු වී ඇති බවටද පිළිගත්තේය.

මේ අනුව අප රට සතුව පැවති විදෙස් සංචිතවල සැලකිය යුතු පහලයෑමක් පෙන්නුම් කරමින් ඉදිරි වර්ෂය තුළ ගෙවීමට ඇති ණය වාරික ගෙවා ගැනීමටද, අත්‍යවශ්‍ය ආනයන සිදුකරගැනීමටද නොහැකි වී රට බංකොලොත්භාවයට පත්වීමට වැඩි ඉඩකඩක් පවතින බව පිළිගත යුතුය. දැනටද ඛනිජ තෙල් ආනයනය කිරීමට නොහැකිව බරපතල මූල්‍ය අර්බුදයකට ආණ්ඩුව මුහුණ දී ඇත.

මසකට තෙල් ආනයනය කිරීමට ඩොලර් මිලියන 360ක් වැයවන අතර අද වන විට එම මුදල් සොයාගැනීමට නොහැකි මට්ටමකට මෙම මූල්‍ය අර්බුදය උඩුදුවා ඇත. එය රටේ සමස්ත ආර්ථික දේහයම අකර්මණ්‍ය වීමට බලපානු ඇත. කර්මාන්ත කඩාවැටීම, විදුලිය ඇණහිටීම, භාණ්ඩ හා සේවාවන්වල මිල අධික ලෙස ඉහලදැමීමට සිදුවීම, සාමාන්‍ය දෛනික ජන ජීවිතයට බාධා පැමිණීම මෙම ඛනිජ තෙල් ආනයනය ඇණහිටීම නිසා සිදුවිය හැක.

එසේම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රැගත් බහාලුම් 1000ට වැඩි ප්‍රමාණයක් වරාය තුළ සිර වී ඇත්තේද මෙම මූල්‍ය අර්බුදයේම ප්‍රතිඵලයක් ලෙසය. මේ නිසා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟ වී ජනතාවට පෝලිම්වල කාලය ගෙවා ආහාර ද්‍රව්‍ය සොයාගැනීමට සිදු වී ඇත. එමෙන්ම රසායනික පොහොර ඇතුලු අනෙකුත් භාණ්ඩ ආනයනය කිරීමට ආනයනකරුවන් කිසිවෙකු ඉදිරිපත් නොවන තත්වයක් උද්ගත වී ඇත. මෙය රටේ කෘෂිකර්මාන්තය බිඳවැටීමට හේතුවන අතර ආහාර හිඟයක් නිර්මාණය වීමේ දැඩි අවදානමක් උද්ගතව ඇත.

එසේම ආණ්ඩුව විසින් ඩොලරයේ අගය ඉහලයාම බලහත්කාරයෙන් රඳවාගෙන තිබීම ආනයනයකරුවන් අධෛර්යමත් වීමට හේතු වී ඇත. ආණ්ඩුව ඩොලරයේ අගය රු.202කට කොටුකළද වෙළෙඳපොළේදී ඩොලරය විකිණෙන්නේ රු.240-රු.260 දක්වා මිලකටය. මෙම තත්වය ආනයනයට පමණක් නොව රටේ විදෙස් ප්‍රේෂණ අඩුවීමටද බලපා ඇත. මන්ද ආණ්ඩුව ඩොලරයකට රු.202ක් පමණක් ගෙවන නිසා එම මුදල් රඳවාගෙන සිටීමට විදෙස්ගත ශ්‍රමිකයන් උත්සහා දරයි.

මෙසේ ආර්ථිකයේ සෑම පැතිකඩක්ම අක්‍රීය වී, දැවැන්ත මූල්‍ය අර්බුදයකට මුහුණදී සිටින තත්වයක් තුළ, රට බංකොලොත්වීම නවතාලීමට වත්මන් අසාර්ථක පාලකයින්ට නොහැකි වී ඇත්තේ මුලු ධනේශ්වරයේම අසමත්භාවය නැවත නැවතත් පසක් කරමිනි.



# මිනිස් හදවතක ගීතය

## BALLAD OF A SOLDIER



ඔබට ඉතිරිව තියෙන්නෙ තව දවස් හතරක් පමණක් නම්, ඔබ මොනවද කරන්නෙ? නිකමටවත් හිතලා තියෙනවද එහෙම දෙයක් ගැන ....? ඔව්... ඒ වගේ වෙලාවක ඔබත්, මමත් තෝරා ගනීවි, මෙතෙක් ජීවිතේ අපට මගහැරුණු දේවල් කරන්නට... මගහැරුණු හීන උදාකර ගන්නට... ඉතිරිව ඇති හැම තත්පරයක්ම අපේ සතුට වෙනුවෙන් වෙන් කරන්නට..! එහෙම නේද....? ඒත් කෙනෙක්ට පුළුවන් නම් තමන් ලද ඒ අසීමිතව වටින සීමිත කාලය පවා අන් අයගේ සතුට වෙනුවෙන් පුදන්නට...? ඒ වගේ හිතක් කොච්චර නම් දයාර්ද්‍ර බවෙන් බර වී ඇත්ද? ඔව්...! මේ දිගහැරෙන්නේ එවන් හිතැති මිනිසෙකුගේ කතාවක්..!

Ballad of The Soldier තුළින් අල්යෝෂා ස්කෝර්සොව් නම් අපූරු මිනිසාගේ ජීවිතයේ සිව් දිනක් එක මිටට කැටිකර ඔබ හමුවට රැගෙන එන්නේ ආදරයෙන් හා මනුෂ්‍යත්වයෙන් පිපාසිත ලෝකය නිවාලන සිහිල් පැන් දෝතක් ලෙසය. 1959 දී තිරගත වුණු මෙම රුසියානු චිත්‍රපටයේ අධ්‍යක්ෂණය Grigory Chukhray විසින් වන අතර නිෂ්පාදනය M. Chernova විසිනි.

මරණයේ ගිනිවිසිවෙන කාලතුවක්කු දැන් ඔහු ඉදිරියේයි. ඉදිරි ආරක්ෂක වළල්ලේ තනිවුණු යන්තම් අවුරුදු දහනවය පසු කළ ඒ කොලු ගැටයාගේ එකම ගැලවුම්කාරයා වුණේ ද ඔහුමයි. වෙඩි උණ්ඩ ඉදිරියේ සටන අතහරින පුරුද්දක් රතු සෙබළෙක්ට තිබේවිද? ඔහුත් රතු සෙබළෙක්! මහා විශාල කාලතුවක්කු දෙකක් මේ හීන්දෑරි තරුණයාගේ ධෛර්යය ඉදිරියේ පරාද වෙන්නෙත් අන්න ඒ නිසයි.

"වීරයා! ඔබ විශිෂ්ටයි!! ඔබව ගෞරව සම්මානයකට නිර්දේශ කරනවා."

"ජෙනරල් සහෝදරයා. සම්මානයක් වෙනුවට, මට මගේ අම්මව බලලා එන්න පුළුවන්ද?"

"ඔබේ වයස කීයද?"

"දහනවයයි. මම ගෙදරින් එනකොට අම්මට සමුදෙන්නවත් වුණේ නැහැ. අම්මගෙන් ලියුමක් ලැබුණා. ගෙදර වහල තෙමෙනවා කියලා. කරුණාකරලා මට දවසක් දෙන්න ජෙනරල් සහෝදරයා. වහල හදලා එන්නම්."

"මේ තියෙන තත්වෙත් එක්ක එක දවසකින් ඔබට අමාරු වේවි. අපි ඔබට දෙනවා යන්න දවස් දෙකකුත්, එන්න දවස් දෙකකුත්.. මම හිතනවා ඔබ වෙලාවට වාර්තා කරයි කියලා.. "

හැමදාම ගුරුපාර දිගේ අනන්තය දිහා බලාන, ජීවත්ව සිටින බවවත් නොදන්නා තම පුතා එනතුරු ඇඟිලි ගනිමින් සිටින අම්මා වෙනුවෙන්, ඒ අදරැති අල්යෝෂා සිව්දිනක් වෙන්කර ගත්තේ එලෙසයි. ඔබට හිතෙන්නේ කොහොමද? අපට දින හතරක නිවාඩුවක් ලැබුණුවිට මෙන් ඔහුද දිනක් තුළ ගමට ළඟා වී දින දෙකක් ගෙදර හිඳ, පසුදා එන්නට ඇත්ද? නැත්නම්..?

යුද්ධයක් කෙතරම් බිහිසුණුද? බිඳුණු ඉරුණු මිනිසුන් හැර ඉතිරි වන්නේ මොනවාද? ඒ හැම යුද්ධයක් අස්සේම හිත්වල ආදරය, මනුෂ්‍යත්වය වපුරන්නට ඇත්නම් එය කෙතරම් අගේද? දිනක් හෝ දෙකක් තම මවුන් සමඟ සතුටින් කාලය ගතකර පැමිණෙනවා වෙනුවට අල්යෝෂාට ඉතුරුවන්නේ අම්මාගේ කම්මුල් උණුසුම් හාදුවලින් තෙත්කර, තමන් ජීවත්ව සිටිනවා යැයි කියා ඒමට මිනිත්තු කිහිපයක් පමණි. වචනවලට පෙරළිය නොහැකි මව් සෙනෙහස, සෙබළෙකු ලෙස රට වෙනුවෙන් මඟනොහැරිය හැකි වගකීම සමඟ මුහුණට මුහුණ හමුවූ විට හදවත් පසාරු කරගෙන යන තරමේ වේදනාවක් කඳුළුවලට පෙරළේ.

Ballad of The Soldier සිනමා නිර්මාණය ජයගන්නේ එතැනදීයි. 1960 වසරේ Cannes සම්මාන උළෙලේ ජූරියේ විශේෂ සම්මානයද, San Francisco ජාත්‍යන්තර සම්මාන උළලේ හොඳම චිත්‍රපටය හා අධ්‍යක්ෂණය සඳහා වන Golden Gate සම්මානද ඇතුළු තවත් සම්මාන රැසකින් මෙම චිත්‍රපටය පිදුම් ලබන්නේ ද මෙහි එන සංවේදී, සූක්ෂම හා අතිදක්ෂ කලා භාවිතය නිසාමයි.

යුද්ධයෙන් පාදයක් අහිමි වූ නාඳුනන වාස්යාට තම ප්‍රියාදරිය සොයා දීමට උපකාර නොකළා නම්, තම සටන් සගයන් වෙනුවෙන්, ඔවුන්ගේ සතුට වෙනුවෙන් කාලය වෙන් නොකළා නම්, එකට දුක සැප බෙදාගනිමින් සිටි මිනිසුන් බෝම්බවලින් පිපිරී දැවී අළුව යද්දී ඔවුන්ගේ දිවි බේරාගැනීමට ඉදිරිපත් නොවුණා නම් අල්යෝෂාගේ චාරිකාව සැපවත් වනු නොඅනුමානයි. දුම්රියේදී ඔහුට හමුවුණු, ඒත් මඟහැරුණු ඔහුගේ ආදරය සොයා ගියා නම්, ඔහු වර්ණවත් වනු නොඅනුමානයි. නමුත් ඔහු තෝරාගත්තේ ඔහුගේ සතුට පමණක් නොවේ!

ඉදින් අල්යෝෂාගේ ඒ චාරිකාව සැපවත් වනු වෙනුවට අර්ථවත් වන්නේත්, අල්යෝෂාගේ ජීවිතය තවත් එක් ජීවිතයක් පමණක් නොවන්නේත්, ඔහුගේ ඒ උතුම් මානුෂීය හදවත නිසාමයි. Ballad of the soldier හි අල්යෝෂා අපේ හදවත් තුළ සදාකාලික වීරයෙක්ව රැඳෙන්නේත් ඒ නිසාමයි!!

## සරදියෙල්ගේ කොලම

48 සුද්දෝ ගියා. අපිට බය වෙලා එහෙම නෙමෙයි බොලං. උන්ටම ඇති වෙලා. උන්ට පුදුම විශ්වාසයක් තිබ්බේ ආයිබෝං, උන්ගේ කකුල් ලෙවකකා හිටපු කලු සුද්දෝ ගැන. උන් දැනන් හිටියා මෙහේ කලු සුද්දොන්ව මුදුනා කරලා ගියොත් උන්ටත් වඩා හොඳට උන්ට ඕනි විදියට පාලනය කරනවා කියලා.

සුද්දා ඉද්දි ගල් විදලා මුලු උඩරටම ආවරණය වෙන්න කෝච්චි පාර හැදුවා, ඒක තව අඟලක්වත් දික්කරන්න කලු සුද්දොන්ට බැරි උනා. සුද්දා ඉද්දි තේ කෝපිවලින් ලංකාවේ නම ලෝකයේ සලකුණු කළා. අද වෙද්දි ඒකත් නැති කරලා දාන්න කලු සුද්දන්ට පුලුවන් උනා.

රවට්ටන්න සහ රැවටෙන්න මේ තරම් දක්ෂ ජාතියක් සරදියෙල් නම් ලෝකෙ කොහේවත් දැකලා නෑ. රෑ වැටිච්ච වලේ උදේ වැටිලා, ආපහු දවලුත් වැටිලා, හවසත් වැටෙනවා.

හොඳටෝම කරන්න ආපු කෙනා දැන් කියනවා හැම දේටම එයාට බනින්න එපාලු. කොරෝනාලු මේ ඔක්කොම කළේ. කොරෝනා කොරොන්ටයින් ගසාකෑම, වැක්සින් එකේ මිල හංගලා ගැහීම, ඇන්ටිජන් ගසාකෑම මේ ඔක්කොම විරුවාට හොරෙන් යාලුවෝ සෙට් එක කරලා තියෙන්නේ. විරුවා පව්!. බබා! මුකුත් දන්නෑ. සරදියෙල්ට අහු උනොත් විරුවාව හිටවනවා කුඹුරක පඹයෙකුට!.

විරුවා ළඟදි මරු කතාවක් කියනවා සරදියෙල් අහගෙන. "මං හරි නැත්නම් ආයේ හිටපු උන්ට දෙන්න එපා. අලුත් කට්ටියකට දෙන්න." විරුවාටම තේරිලා වගේ විරුවා ෆේල් කියලා.

කෝප් එකේ වටිනාකම රටට කියලා දීපු හඳුන් මහත්තයා බොහොම අල්පේච්ඡ ජීවිතයක් ගතකරමින් දේශපාලනය කරන හැටි කිව්වාම, කෝචොක් දාපු එළහරක්ට අගමැට්ටාගෙ පුත්‍රරත්නය- යෝෂී ගැහුවා කනේ පාරක්. අල්ලපු රටේ කෝවිල් වඳින්න ප්‍රයිවට් ජෙට් දුන්නේ නම නොදන්න යාලුවෙක්ලු. ඒක නිකන් ඩේසි ආච්චිගේ දෙවෙනි එපිසෝඩ් එක වගේ.

ජේවීපී යූත් එකට මේ දවස්වල කොල්ලෝ කෙල්ලෝ සෙට් වෙන හැටි දැක්කම නම් සරදියෙල්ට පුදුම ආශ්වාදයක් ආවේ. එක එක ජාතියේ ලස්සන ලස්සන කොල්ලෝ කෙල්ලෝ ලස්සන ලස්සන වැඩ කරකර රට වටේම ඒකරාශී වෙන හැටි දැක්කම සරදියෙල්ට නම් හිතෙන්නේ ඇත්ත සිස්ටම් චේන්ජ් එකක් හෙට අනිද්දාම වෙයි කියලා. සතුට සොයාගෙන මේ රට දාලා වෙන රටවල්වලට පනින්න හිතනවා වෙනුවට මේ ලස්සන පුංචි රට හැමෝටම සතුටෙන් ජීවත්වෙන්න පුලුවන් රටක් කරන්න මේ ධෛර්යවන්ත කොල්ලෝ කෙල්ලන්ට පුලුවන් වේවි!.

නූතන පරපුරේ සරදියෙල්



# සාපි නගර් වනසන හොර වැලි ලයිසන් සාපය

ස්වභාවික ඩෙල්ටාවක් ලෙස වර්ධනය වන මහවැලි ගඟේ සාපි නගර් ප්‍රදේශයේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් සිදුකරන මහා පරිමාණ වැලි කැණීම් සඳහා අහංගම වැලි කැණීම් සමාගමට මේ වන විටත් බලපත්‍ර ලබා දී තිබේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මහා පරිමාණ කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කරන්නේ නම් ඒ සඳහා පාරිසරික තක්සේරුවක් සිදු කර එකී පරිසර පද්ධතියේ සංවේදීතාවය පිළිබඳ අධ්‍යයනය කළ යුතුය.

එසේ නොමැතිව මහා පරිමාණ වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරීම නීති විරෝධී ක්‍රියාවකි.
මීට පෙර මෙම ප්‍රදේශයේ සුළු පරිමාණ වැලි කැණීම් සඳහා ප්‍රදේශවාසීන් විසින් බලපත්‍ර ඉල්ලා සිටියද කූඩ මගින් වැලි කැණීමෙන් මෙම ස්වාභාවික පරිසර පද්ධතියට හානි විය හැකි බව පවසා එම කාර්යාංශය විසින් එය ප්‍රතික්ෂේප කර තිබිණි.

එමෙන්ම විසල්මා කන්ස්ට්‍රක්ෂන් නම් ආයතනයක් විසින් ද වැලි කැණීම සඳහා බලපත්‍ර ඉල්ලා සිටි අවස්ථාවේදීත් එම ප්‍රදේශයේ ඇති පාරිසරික සංවේදීභාවය නිසාම එම බලපත්‍රය ලබා දීම කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කොට තිබිණි. නමුත් එවන් තත්වයක් යටතේ වුවද ඉහත කී සමාගමට අද වන විට මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර යොදා මෙම ප්‍රදේශයේ අනවසර වැලි කැණීමට අවසර දී ඇත. සාපි නගර් ප්‍රදේශය යන මහවැලි ගඟ විසින් පරිණාමිකව ගලා යාමේ දී ස්වභාවික ලෙස නිර්මාණය වූ ජල තටාක හා වැලි නිධි විශාල ප්‍රමාණයක් ඇති ප්‍රදේශයකි. එමෙන්ම එය ස්වභාවික පාරිසරික සංවේදී කලාපයකි. එනයින් මෙලෙස එම වැලි නිධි එකී ප්‍රදේශවලින් ඉවත් කිරීමක් කරන්නේ නම් ඒ සඳහා නිසි ලෙස අධ්‍යයනයක් සිදුකළ යුතුය. සාමාන්‍යයෙන් ගම්මුන් විසින් ප්‍රදේශයේ වැලි ඇති දැයි සොයාගන්නේ ප්ලාස්ටික් බටයක් පොළොව යටට යවා වැලි ස්ථරයේ ප්‍රමාණය මැන ගැනීමෙනි. හාස්‍යයට කරුණක් වන්නේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පවා මෙම වැලි බලපත්‍ර නිකුත් කිරීමට පෙර වැලි නිධියේ ඝනත්වය මැන ඇත්තේ ද මේ ආකාරයට වීමය. මෙලෙස මැනීම් කර බලපත්‍ර දීමට නම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කියා දෙයක් අවශ්‍ය වන්නේ නැත. වැලි කැණීම්වලින් අනතුරුව ඇති විය හැකි ව්‍යසනයන් පාලනය කිරීමට හැකි නම් පමණක් ඒ සඳහා අවසර දීම විද්‍යාත්මක ක්‍රමය වේ. නමුත් මෙහිදී දේශපාලන බලපෑම් මත පිහිටා කිසිඳු විද්‍යාත්මක පදනමක් නොමැතිව මෙම වැලි කැණීම් බලපත්‍ර නිකුත් කර තිබේ. 2021/57/LS අංකයෙන් නිකුත් කරන ලද 2021 වසරේ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ වැලි කැණීම් සම්බන්ධ වාර්තාවට අනුව වැලි බලපත්‍ර අධික ප්‍රමාණයක් දැනටමත් නිකුත් කර ඇති නිසා එමඟින් මහවැලි ගඟේ ඉවුරට විශාල හානි සිදුව ඇත. එමෙන්ම ප්‍රදේශයේ ජලයේ ලවණතාවය වැඩි වී ඇති බව පර්යේෂණ මඟින් සනාථ වී ඇත.

එයට අමතරව කලුගල් වැලි, පස්, බොරළු හා මැටි කැණීම් ප්‍රවාහනය හා වෙළඳාම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර මහතා විසින් පසුගිය ඔක්තෝම්බර් මස 11 වැනි දින 02/2021 දරණ චක්‍රලේඛය නිකුත් කිරීම මඟින් ද රටේ ගංගා පරිසර පද්ධතිය බරපතල ලෙස විනාශයට ඇද දැමේ.

2020 ඔක්තෝම්බර් මස හය වන දින 2196/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පත් කළ කමිටුවට අනුව වැලි ගොඩදැමීම හා ප්‍රවාහනය සම්බන්ධව ඇති බාධා නිසා වැලි ගොඩදමන ජනතාව සහ සමාගම් සියල්ල අපහසුතාවයට පත්ව ඇති බව පැවසේ. ඒ අනුව එම අපහසුතාවයන්ගෙන් ජනතාව මුදවා ගැනීමට නැවත වැලි හා ඛණිජ බලපත්‍ර ලබා දීම වෙනුවෙන් යැයි පවසා නැවතත් වැලි ජාවාරමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීමට මෙමඟින් උත්සාහ කොට ඇත.

එමෙන්ම මහවැලි ගංගාවේ දකුණු ඉවුරට පමණක් ලබාදුන් වැලි ගොඩදැමීමේ බලපත්‍ර වම් ඉවුරටත් ලබාදීම මෙම රජය යටතේ 2021 වර්ෂයේ දී ආරම්භ කර ඇත. ඒ යටතේ සේරුවාවිල සිට කින්නියා ප්‍රදේශය දක්වා කිලෝමීටර විසිදෙකක් තුළ වැලි බලපත්‍ර 1300ක් ලබා දී ඇති බවද දැනගන්නට තිබේ.

මෙම තත්වය හේතුවෙන් ප්‍රදේශයේ බරපතල පාරිසරික හානියක් සිදුවී ඇත. මේ වන විට කන්තලේ හා සේරුවාවිල ගොවි ව්‍යාපාරවල අක්කර හැට දහසක් පමණ වගා කරන අතර වැලි ගොඩදැමීම නිසා ඇති වී ඇති ලවණතාවය හේතුවෙන් වී ගොවිතැන් බරපතල ලෙස විනාශ වෙමින් තිබේ. එහෙයින් අද වන විට මහවැලි නදියේ සාපි නගර් හි ලබාදී ඇති හොර වැලි ලයිසන් මුළු රටමත්, සමස්ථ පරිසර පද්ධතියටත් සාපයක් වී හමාරය.

]රවින්ද්‍ර කාරියවසම්[

ඒ පාරෙත් මේ පාරටම...

# කාන්තාවට විමුක්තිය ඇත්තේ කොතැනද?



පසුගිය දා පාර්ලිමේන්තුවේ පැවති විවාදයක් අතරතුරදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විසින් එක්තරා මන්ත්‍රීවරියක ඉලක්ක කරමින් කරන ලද " දෙපැත්ත කැපෙන" සුළු ප්‍රකාශයක් හේතුවෙන් රටම ඇවිළී ගියේය. අපේ රටේ පාර්ලිමේන්තුවටත්, සමාජයටත් මෙවැනි අත්දැකීම් සුලබය. ඒ කොතෙක්ද යත් ඒවා ඉතාමත් සාමාන්‍යකරණය වී ඇත්තේය. අම්මට බැන්නම නහුතෙට තදවෙන ගොඩක් අයට කාන්තාව හා ඔවුන්ගේ ලිංගිකත්වය ගැන ඇත්තේ ඉතා අවඥාසහගත ආකල්පයකි.

ලිංගික සූරාකෑමෙන්ද ශ්‍රම සූරාකෑමෙන්ද පීඩා විඳින කාන්තාවෝ උතුරේත්, දකුණේත්, කඳුකරයේත් සෑම අහුමුල්ලකදීම අපට මුණගැසේ. ඇයද මේ සමාජ ක්‍රමය තුළ පීඩාවට පත් වන අවවරප්‍රසාදිත පිරිසෙන් අයෙකි. වතුකරයේ මෙන්ම බොහෝ රැකියාවලදීද කාන්තාවන්ට ගෙවනු ලබන්නේ අඩු වැටුපකි. ඇය පාසලේදී, මහමගදී, රැකියාවේදී මෙන්ම සිය නිවස තුළදීද ශාරීරික, මානසික හා ලිංගික හිංසනයටත්, අපයෝජනයටත්, පීඩාවටත් පත් වේ. රටේ කාන්තාවන් සියයක් අපයෝජනය කළ එක්තරා ප්‍රාදේශීය දේශපාලඥයෙක් විසින් එය සමරනු වස් ප්‍රියසාදයක් පැවැත්වූ පුවතද ඔබට මතක ඇති.

කාන්තාවන්ට එරෙහි ඕනෑම ආකාරයක හිංසනයක් වැළැක්වීම සහ ඔවුන්ට කෙරෙන වෙනස්කම් වැළැක්වීම සඳහා ප්‍රඥප්තියක් අත්සන් කළ ලොව ප්‍රථම රට වන්නේ සමාජවාදී කියුබාවයි. එරට කාන්තා සහ පිරිමි වැටුප් සමානය. එමෙන්ම කියුබාවේ දේශපාලන නායකයින්ගෙන් 42%ද, පාර්ලිමේන්තු නියෝජිතයින් 612න් 299ක්ද, කොමියුනිස්ට් පක්ෂ සාමාජිකත්වයෙන් 43%ද, වෘත්තිය සමිති සාමාජිකත්වයෙන් 56%ද, විද්‍යා පර්යේෂකයින්ගෙන් 53%ද වන්නේ කාන්තාවන්ය.

එසේම එරට දරුවන් වැදීම පිළිබඳ තීරණය කිරීමේ අයිතිය ඇත්තේද කාන්තාවටය. කාන්තාවකට සිය දරු උපතට මාස එකහමාරකට පෙර සිට ප්‍රසූතියෙන් පසු මාස තුනක් යන තුරු පූර්ණ වැටුප් සහිත නිවාඩු හිමිය. කැමතිනම් දරුවාට අවුරුද්දක් වන තුරු 60%ක වැටුප් සහිත නිවාඩු ලැබිය හැකිය. අවුරුදු 60 ඉක්මවීමෙන් හෝ වසර 30ක සේවා කාලයෙන් අනතුරුව විශ්‍රාම ලබාගන්නටද කාන්තාවට හැකියාව ලැබේ.

සෝවියට් දේශය තුළද මෙවැනි උදාහරණ ඕනෑතරම්ය. එහෙත් 1990න් පසු එහි සමාජවාදය බිඳවැටීමෙන් අනතුරුව අද වන විට එහි කාන්තාවගේ ජීවන මට්ටම බරපතල ලෙස කඩාවැටීමකට ලක්ව ඇත. රැකියා අහිමි වීම, අඩු වැටුප්, කාන්තාව යළිත් ගෘහයම වහළියක් බවට පත්වීම, පීතෘමූලික පවුල් සැකැස්මක් තුළින් පිරිමියා වඩාත් බලවත් වීම, කාන්තාවට එරෙහි හිංසනය වැඩි වීම හා ඇයගේ සමාජීය මට්ටම බිඳවැටීම ආදිය වඩාත් තියුණු ලෙස කැපී පෙනේ.

ඉදින් අපට අවශ්‍ය වන්නේ කාන්තාවගේ විමුක්තියට ඉඩහදන දියුණු සමාජයක් නොවේද? ඒ ප්‍රාර්ථනය ඉටු කළ හැක්කේ සමාජ සාධාරණත්වය හා සමානාත්මතාවය සහිත සමාජවාදී සමාජ ක්‍රමයකට නොවන්නේද?

*"කාන්තාවට සම්පූර්ණ විමුක්තිය ලබාදීමට සහ පුරුෂයා හා සම තත්වයට ගෙන ඒමට ජාතික ආර්ථිකය සමාජවාදීකරණය කිරීමත්, කාන්තාවන් පොදුවේ ඵලදායී ශ්‍රමයේ නිරත කරවීමත් අවශ්‍ය වේ."*

*(ලෙනින් - කාන්තා විමුක්තිය ගැන : 93 පිටුව)*



## Japanese lickable TV - ටෙලිවිෂනයෙන් රස බලමුද?

ජපානයේ Meiji විශ්වවිද්‍යාලයේ Homei Miyashita විසින් ටෙලිවිෂනය නරඹන්නන් හට ඉන් දකින දේ රස බැලීමට හැකි රූපවාහිනී තිරයක් නිර්මාණය කර ඇත. මේ නිසාම මෙය (TTTV) බහු සංවේදී නැරඹුම් අත්දැකීමක් ලෙසද හැඳින්වීමට පුළුවනි. කෙසේවුවද තාක්ෂණය මේ තරම් අපට සමීප වීම ගැන අපගේ හැඟීම සතුටුදායක වුවද, මේ සඳහා ඔවුන් විසින් යොදා ගන්නා ලද තාක්ෂණික උපක්‍රම හේතුවෙන් මිනිසාගේ සෞඛ්‍යයට කිනම් බලපෑමක් ඇතිවේද යන්න ගැනත් අප දැනුවත් විය යුතුය.

## Mojo Lens - පෙනෙන දේට වඩා දෙයක්!



මේ කතා කරන්න යන්නෙත් ඇසට දමන කාචයක් ගැන තමයි. හැබැයි එය ඔබ සිතනවාට වඩා වෙනස්. මෙම Mojo Lens කාචය යනු අපි හැමෝම දන්න AR තාක්ෂණය ඇතුළත් කාචයක්. AR තාක්ෂණය සහිත කාචයක් මිනිස් ඇස තුළ ක්‍රියාත්මක කිරීමට හැකිවීම තුළින් අසීමිත ප්‍රයෝජන රාශියක් ළඟා කර ගැනීමට පුළුවන්. විශේෂත්වය වන්නේ සැබෑ ලෝකය සමඟ අපි කරන ගනුදෙනුවට කිසිම ආකාරය බලපෑමක් කිරීමට මෙම Lens එකට නොහැකි නමුත් අප අවධානය දෙන දේ සමඟ නිවැරදි දත්ත ලබා දෙමින් අපගේ ක්‍රියාවන්ට පහසුව සැලසීමයි.

## FLEXOUND Pulse දැනෙන්න බලමු....



නව FLEXOUND Pulse පුටුව ඔබේ සිනමා අත්දැකීමට නව හැඟීමක් ගෙන එයි. වචනාර්ථයෙන්ම කියනවා නම් මෙමගින් ත්‍රාසජනක චිත්‍රපටයක කම්පනයන් විඳගැනීමේ හැකියාව ඔබට ලබා දී තිබේ. එයින් ඔබට දැනෙන ශබ්ද ලබා දීම සඳහා පුටුවේ තනා ඇති ස්පීකර් භාවිතා කරයි. ඒ විතරක්ම නෙවෙයි, සිනමා ශාලාවක දී ඔබ බලාපොරොත්තු වන සියලුම ආකාරයේ තීව්‍ර හඬ ලබා දෙයි. දැනට මෙම පුටු සංකල්පය සිනමාහල් සඳහා පමණක් ලබා දී තිබේ.

## Sleepace Sleep Dot සැහැල්ලු නින්දකට...




සාමාන්‍යයෙන් ස්මාර්ට් ඔරලෝසුවක් පැළඳීමෙන් හෝ ඔබේ මෙට්ටය වටා සංවේදකයක් සවිකිරීමෙන් පරිශීලකයා බලාපොරොත්තු වන සැහැල්ලු නින්ද යම් තරමක අවහිරතාවයක් ඇති වේ. මේ නිසාමයි අපට Sleepace Sleep Dot කොට්ටය වැදගත් වන්නේ. මෙය බැලූ බැල්මට සාමාන්‍ය කොට්ටයකි. එහෙත් එතුළ ඇති සන්වේදක උපකරණ මඟින් ඔබට සැහැල්ලු නින්දක් ලබා දෙමින් ඔබගේ නිද්‍රා චක්‍රය සහ සිරුරේ චලනයන් ද නිරීක්ෂණය කරයි. එසේම මිහිරි ශබ්ද සහ සංගීතය සමඟින් උදෑසන ඔබව අවදි කරන්නත් මෙම අපූරු කොට්ටය වගබලා ගනී.

Gadget Video

## ICC ක්‍රිකට් සම්මාන 2021




2021 අයි.සී.සී. සම්මාන ප්‍රදානෝත්සවයට අදාළ වසරේ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයාට හිමි නිර්දේශිත නාම ජගත් ක්‍රිකට් කවුන්සිලය (අයි.සී.සී) විසින් නිවේදනය කෙරිණි.

ඒ අනුව එම සම්මානය සඳහා නිර්දේශිත නාමයන් හතරක් ඇතුළත්ය. ඊට ශ්‍රී ලංකා නායක දිමුත් කරුණාරත්නගේ නම ද ඇතුළත්ව තිබීම විශේෂත්වයකි.

ඔහුට අමතරව එංගලන්ත නායක ජෝ රූට්, ඉන්දියාවේ රවිචන්ද්‍රන් අශ්වින් හා නවසීලන්තයේ ක්යිල් ජමීසන් ද වසරේ ටෙස්ට් ක්‍රීඩකයාට හිමි සම්මානය සඳහා නිර්දේශ කර තිබේ.

2021 වසරේ ජනවාරි පළමු වැනිදා සිට දෙසැම්බර් 31 වනදා දක්වා කාලය තුළ ජාත්‍යන්තර ටෙස්ට් පිටියේ දැක්වූ දක්ෂතා සැලකිල්ලට ගනිමින් මෙම සම්මානය පිරිනැමීමට නියමිතයි.

වසරේ ටෙස්ට් ක්‍රීඩකයා ඇතුළු සෙසු ප්‍රධාන අයි.සී.සී. සම්මාන (පිරිමි අංශයේ) හිමි කර ගත් ක්‍රීඩකයින්ගේ නම් ජනවාරි 24 වනදා ප්‍රකාශයට පත් කිරීමට නියමිත බව ජගත් ක්‍රිකට් කවුන්සිලය සඳහන් කෙරිණි.



## ශ්‍රී ලංකාවට තවත් ජයග්‍රහණයක්




බංගලාදේශයේ දී පවත්වන ලද Yonex Sunrise Bangladesh ජාත්‍යන්තර බැඩ්මින්ටන් අභියෝගතා කුසලානය - 2021 පසුගිය දා පැවැත්වුණි. ඒ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ කණ්ඩායමේ ශ්‍රී ලංකා යුද හමුදා බැඩ්මින්ටන් ක්‍රීඩා කමිටුවට අයත් ක්‍රීඩකයින් වන ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකායේ සාමාන්‍ය සෙබළ B.T.D.D ගුණතිලක සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ ආධුනික සෙබළ H.S.P ඩයස් විසින් එහි අවසන් පිරිමි ද්විත්ව තරඟයේ ශූරතාවය දිනා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවට අමතරව ඉන්දියාව, මැලේසියාව, මාලදිවයින, බංගලාදේශය, ඉන්දුනීසියාව, තායිලන්තය, සැම්බියාව සහ සිම්බාබ්වේ යන රටවල් ද එම තරඟාවලිය සඳහා සහභාගී විය.

## බර ඉසිලීමෙන් රන් පදක්කම් හතරක්...

තුර්කියේ ස්තාන්බූල් නගරයේ පැවති Asian classic Equipped Bench Press and Powerlifting Championship තරඟාවලියේ කිලෝග්‍රෑම් 47 බර පන්තියේ ශූරතාව ඇතුළු රන් පදක්කම් 04 ක් දිනා ගැනීමට ලාංකික ක්‍රීඩිකා ෂෙනුකි දිශල්‍යා (Shenuki Dishalya) සමත් වී තිබේ.

බර ඉසිලීම, පිහිනුම් හා ජිම්නාස්ටික් වැනි අංශ කිහිපයකින්ම ජාතික තලයේ දක්ෂතා දක්වා ඇති ඇය කොළඹ බිෂොප් විද්‍යාලයේ ශිෂ්‍යාවකි.



# බහු සෛලිකයෝ බිහිවෙති

පෘථිවියේ මුල්ම ජීවීන් වන ඒක සෛලික ජීවීන් බිහි වූ ආකාරය සහ ඔවුන්ගේ හැසිරීම පිළිබඳ පසුගිය කලාපයෙන් අප සාකච්ඡා කළා. ඉන්පසුව ජීවීන් තැබූ පියවර කුමක් දැයි අද අපි සොයා බලමු.



ජීව පරිණාමය මෙසේ සිදුවෙද්දී ප්‍රෙටොරොසොයික අවදියට අයත් වසර මිලියන දෙදහසක් පමණ වූ දීර්ඝ කාල පරිච්ඡේදය තුළ පෘථිවි පෘෂ්ඨයේ නොයෙක් විපර්යාසයන් රැසක් සිදු විය. මෙයට වසර මිලියන 1100කට පමණ වන විට පෘථිවි පෘෂ්ඨය තැන තැන විසිර පැතිර ගිය කුඩා බිම්කඩවලින් සමන්විතව තිබුණි. මෙම බිම්කඩවලින් ද වැඩි කොටස වූයේ ජලයෙන් යටය. වෙන්ඩියන් අවදිය යැයි හඳුන්වනු ලබන මෙයට වසර මිලියන 650කට පෙර සිට 544 දක්වා පමණ කාලය වන විට එසේ විසිර තිබූ ගොඩබිම් කැබලි එක් වී දැවැන්ත මහද්වීපයක් ගොඩනැගිණ. විද්‍යාඥයෝ මෙම මහද්වීප රුසියන් බසින් 'මව්බිම' යන අරුත දෙන 'රොඩීනියා' හෙවත් "පැන්ජියාව" ලෙසින් හැඳින්වූහ. රොඩීනියාවෙන් වැඩි කොටස වූයේ ජලයෙන් යටය. එහෙයින් මේ මහද්වීපය සමන්විත වූයේ ගොඩබිමට වඩා නොගැඹුරු මුහුදු ප්‍රදේශවලින් යැයි කීම වඩාත් සුදුසුය.

රොඩීනියාවේ විශාලත්වය හෝ පිහිටීම පිළිබඳව පැහැදිලි තොරතුරු ප්‍රමාණවත් තරම් තවම ලැබී නැත. එසේ වුවද එය වත්මන් උතුරු ඇමරිකාව කේන්ද්‍රකොට ගන්නට ඇති බවත්, එය දක්ෂිණ ධ්‍රැව ප්‍රදේශයේ සිට නිරක්ෂය දෙසට විහිද තිබෙන්නට ඇති බවත් විද්‍යාඥයෝ අනුමාන කරති. රොඩීනියාව වටකොට සිටි මහා සාගරය හඳුන්වන ලද්දේ පැන්තලාසා මහා සාගරය නමිනි.

**පැලියොසොයික අවදිය** (වසර මිලියන 544 සිට 245කට පෙර දක්වා)

සංයුක්ත ජීවීන්ගේ සම්භවය හා පරිණාමය අතිමහත් වේගයකින් සිදුවූ අවදියක් ලෙස මෙම අවදිය හැඳින්වීම උචිතය. ලෝකයේ සම්පූර්ණ වයසින් දහයෙන් පංගුවක් පුරා පැතිර ගිය මෙම අවදිය හැඳින්වීම සඳහා පැලියොසොයික යන යෙදුම ඉතා උචිත එකකි. ග්‍රීක බසින් බිඳගත් 'පැලියෝ' එනම් "අතීත" 'සොයික' එනම් ජීවීන් යන දෙවදනින් ගොඩනගා ඇති මෙම යෙදුම මඟින් මෙම අවදිය "ආදී ජීවීන්ගේ අවදිය" යන්න ගම්‍ය කරවයි.

ලෝක ඉතිහාසයේ අපූර්වතම වූ ද, සුවිශේෂී වූ ද සිදුවීම් කිහිපයක් අන්තර්ගත මෙම අවදිය භූ විද්‍යාත්මකව අනුයුග හයකට බෙදා දැක්වේ. එනම්

**කේම්බ්‍රිය - වසර මිලියන 544 සිට 505කට පෙර දක්වා**
**ඕර්ඩොවිසිය - වසර මිලියන 505 සිට 440කට පෙර දක්වා**
**සිලුරිය - වසර මිලියන 440 සිට 410කට පෙර දක්වා**
**ඩෙවොනිය - වසර මිලියන410 සිට 360කට පෙර දක්වා**
**කාබොනිපෙරස් - වසර මිලියන 360 සිට 286කට පෙර දක්වා**
**පර්මියන් - වසර මිලියන 286 සිට 245කට පෙර දක්වා යනුවෙනි.**

## කේම්බ්‍රිය යුගය

(වසර මිලියන 544 සිට 505කට පෙර දක්වා)

**බහු සෛලිකයෝ බිහිවෙති**

ලෝකයේ පරිණාමීය ක්‍රියාවලිය අනවරතයෙන්ම ක්‍රියාත්මක වෙමින් පැවතිණි. දියුණු ජීවීන්ට උචිත පරිසරයක් මැවීම පිණිස එක් සෛලිකයෝ වඩාත් සංකීර්ණ ජීවීන් බවට පරිණාමය වෙමින් සිටියහ. 'උචිතයා ජයගනී' න්‍යාය යළිත් සනාථ කරමින් ඒක සෛලිකයන් වඳවෙමින් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් වූ බහු සෛලිකයන්ට ඉඩකඩ විවර වුණි. බහු සෛලිකයින් විසින් වඩාත් දක්ෂ ලෙස පරිසරයට උචිත හැසිරීම් රටා වර්ධනය කොටගෙන තිබීම මෙයට ප්‍රධාන හේතුව වූ බව පෙනේ. ජලයේ දියව තිබූ ඔක්සිජන් උරා ගනිමින් ශක්තිය ජනනය කිරීමටත්, ලිංගික ප්‍රජනනය මඟින් වර්ගයා බෝ කිරීමටත්, වඩා වේගයෙන් චලනය වෙමින් ආහාර සපයා ගැනීමටත් ඔවුනට හැකියාව ලැබී තිබුණි.

මෙම අවදිය ආරම්භයේ දී බිහි වී සිටි සංයුක්ත ජීවීන්ගේ හැඩරුව කෙබඳු වී ද යන්න පිළිබඳව නියත තොරතුරු සපයා ගැනීමට ප්‍රමාණවත් සාධක නොමැත. කෙසේ වුවද මුල්ම ජීවීන් ඉතා සරල මට්ටමේ වූ ශාඛ හෝ හතු වැනි ඒවා වන්නට ඇති බවට උපකල්පනය කළ හැකිය.

මුල්ම ජීවීන්ගේ ස්වරූපය පිළිබඳව අදහසක් ලබා ගැනීම පිණිස මෙම අවදියට අයත් (වසර මිලියන 544 සිට 505ට පෙර පමණ යුගය) පොසිල කිහිපයක් සපයා ගන්නට විද්‍යාඥයෝ සමත් වූහ.

කේම්බ්‍රිය යුගයට අයත් පොසිල හමු වූ ආකාරයත්, ඒවාගේ ස්වභාවය පිළිබඳවත් අප මීළඟ කලාපයෙන් සාකච්ඡා කරමු.

---

# රැඩිකල් වෙමු!



"රාලේ බැඳපං කිරි පුස්සා - රාලේ බැඳපං අපේ පැඟිරා..."

එකම මගක යන සෙක්කුවක අප දෙතුන් වතාවක් නොව හැත්තෑ තුන් වසරක් තිස්සේම ස්වදේශීය පැඟිරන් පමණක් නොව හයිබ්‍රිඩ් කිරි පුස්සන් ද බැඳ ඇත. කරෙන් ඇදලා පැඟිරන් හා කිරි පුස්සන් මාරු කළේ අපේ රාලලාය. ඒ කවුරුන් හෝ සරු බිමකට ගෙනියතැයි යන අපේක්ෂාවෙනි. නමුත් අපට හිමි වුයේම හරක් පාගා දූවිලි ඇවිස්සී ගිය මුඩු බිම්ම ය. ඒ අතර සෙක්කු කරකැවිල්ලෙන් ලැබෙන තෙල් ටික ද රහසේම මහතැන් වලට යයි. අපි කවදත් කළේ හරක් නඩත්තු කිරීමය.

දැන් දැන් අපි යන්නේ එකම රවුමක බව අවබෝධ වෙමින් තිබේ. සෙක්කු කරකවමින්, මාරුවෙන් මාරුවට හරක් බැන්දාට සරු බිමක් හමුනොවන බව වැටහේ. ඉදින් දැන් අප විය ගසෙන් බැස, සරු බිමක් සොයා යා යුතු කාලය එළැඹ තිබේ. තම තම පෞද්ගලික අභිලාෂයන් මොහොතකට පසෙක ලා මුළුමහත් සමාජයක් වෙනුවෙන් අප සැවොම වෙනස් ගමනක් ආරම්භ කළ යුතුව ඇත.

# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සුදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com



## නගරයේ කවිය

කොහේ අහසත් අහසමය
කොළඹ කියා වෙනස් වෙද
ඒත් ඒ හැමු හුළඟේ
තිබුණෙ වෙහෙසකර දොම්නස...

හැන්දෑව කියා නිහඬ නැත
එක්කො බණ, එක්කො කුණුහරුප
උදේ නොහිටපු කුරුල්ලන්
හවසට කොහෙන් එන්නද...

ෆ්ලැට්වල පුංචි එළි අහුරු
කොළඹ ඉම තෙක් නිදි වදී
කොන්ක්‍රීට් වීදි මත්තේ
කුහුඹුවන් මිය යතී...

රෑට නම් අහස අමුතුය
කොළඹ හන්දා තරු නැතිය
මෙලන්කොලික හඳ පළුව
නගරෙ තරමටම දුක් විඳී...

] **සඳුනි නුවන්තිකා - කොළඹ** [

## දුක උනත් පැණි රසයි

මගෙ හිතත් දැන් නැහැ මගේ ළඟ
නුඹෙ ළඟත් තියෙනවද මන්දා
මතක් වුවත් මතක නැතිකර
ඉන්නවා ඇති තැවුල් හංගා

වචන කැඩී කැඩී ඇනහිටින හිත
ආදරේ ළඟදී ගොළුයි
නොලැබ ලබනා විටදි ප්‍රේමය
වහා ගිනි ඇවිළෙන සුලුයි

දුරින් හිටියත් හිතින් බැඳුනම
සිහින හාදුත් විසිතුරුයි
ඔබට මං මට ඔබ ලැබෙන දා
පැමිණි දුක් හරි පැණි රසයි

] **තදිනි තිලකවර්ධන - මාතර**[

## සිරිමත්ලාගේ ලෝකය

සීත පිනි පොද සුවඳ අතරින්
අමර සාමා නෙළා සල්මල්
කිරි කොකුන් රැළ සමඟ හාදව
පියාඹා විදුමවුන් තුරුලට

පිබිද උදයෙම ඇමැද ගේ දොර
නැමද දෙගුරුන් පෙර පුරුද්දට
පොත පතට වැඳ තබා පසෙකින්
ගල් වළට යයි අදත් සිරිමත්

කොඳු කැඩී සත් මසක් වූ පිය
මහ රජුන් තව ලෑලි ඇඳ මත
කෑශව වැහැරුණු මව්ගෙ ලැම වැඳ
කඳුළු බොන පොඩි සිඟිත්තියකද

සියලු ගුණදම් සිඟිති සිතිවිලි
කැකෑරෙන සිත්මලක් මිලිනව
මල් පෙතිද වැනි සිනිඳු අත්පොඩි
කුසගින්න ළඟ වෙලා අසරණ

පොතට වැඳ යළි පුදා කඳුළක්
ගල් වළට දිවි සින්න වී ගිය
ගුණය හේතුව අහේතුවකට
මැකී වියැකී අලුත් පොත්වල

] **සුරංග සංජීව** [



## දුෂ්කර ක්‍රියා

විප්ලව කරේ සිදුහත්ලා
තනිව යශෝධරාලා
රාහුලයන් සමඟ අරගල කරද්දී..
කෙදිනක හෝ
සියල්ලන්ම හා
නිදුක් වෙන අරමුණෙනි...

]**යශෝධා සමරධීර**[

## අතවත් වනනවද මට...?

තනිකම තනි නොකෙරූ රැයක
මම නිදි නැති සිතුවිලි ලොවක...


ඉර ගිලගත් මහ සයුර උඩ...
සඳ හට 'අහසකි' තනි තරුව...!

දෑසත් හීතෙන් පෙඟෙන විට
අහසම අරියාදුවකි මට...

කවියත් පැද්දෙන වචන ළඟ
මා තනියම කළු මුහුද මැද

ගැහි ගැහි හිත On මතක මැද
කැප්ටන් අතවත් වනනවද?

] **මියැසි රසාංජලී - අනුරාධපුර**[





# ලොව ප්‍රථම කළු ජනරජයේ ඛේදවාචකය

හයිටිය ස්වෛරී රාජ්‍යයක් ලෙස වසර 218ක කාලයක් තුළ අභියෝග රැසකට මුහුණ දී ඇත. වසර 13කට ආසන්න ගැටුමකින් පසුව එය ප්‍රංශයෙන් නිදහස ලැබුවේ 1804දීය. ඊට පෙර Saint-Domingue ලෙස හැඳින්වූ එය ප්‍රංශ වහල් ජනපදයක් ලෙස සියවස් තුනක් ගත කරන ලදී. කෙසේ වෙතත් නිදහසේ මිල අධික විය. ප්‍රංශය හයිටියේ ස්වාධීනත්වය සඳහා මිලක් නියම කළේය. ඒ තමන්ට අහිමි වූ වහලුන් සහ ලාභදායී බෝග සඳහා වන්දි ලෙසයි. එය ෆ්‍රෑන්ක් මිලියන 150ක් වූ අතර පසුව එය මිලියන 90 දක්වා අඩු කළේය. හයිටිය 1825 සිට 1947 දක්වා ප්‍රංශයට මෙලෙස වන්දි ගෙවූ අතර, එහි පිරිවැය පියවා ගැනීමට ඇමරිකානු, ජර්මානු සහ ප්‍රංශ බැංකුවලින් ඉහළ පොලියට ණය ගත්තේය. මෙම ණය චක්‍රය නිසා හයිටි වැසියන්ට සිදුවූයේ විශාල මූල්‍ය බරකට උරදෙමින්, පරම්පරාවෙන් පරම්පරාවට මෙම දරිද්‍රතාවය රැගෙන යාමටයි.

කෙසේ වුවද එයින් පසුවත් වහල් හිමිකාර එක්සත් ජනපදය පවා සිය ආර්ථිකයට තර්ජනයක් වේ යැයි බියෙන් දශක කිහිපයක් තිස්සේ හයිටිය හුදකලා කරන ලදී. එම හුදකලාභාවයේ ප්‍රතිඵලයක් ලෙස හයිටියට කිසි දිනෙක කලාපයේ අවට ශිෂ්ටාචාරයන් සමඟ ඉදිරියට යාමට අවස්ථාවක් නොලැබුණි.

හයිටියේ ප්‍රධානතම බලශක්ති ප්‍රභවය වූයේ ගල් අඟුරුයි. දුප්පතුන්ගේ ආර්ථික පීඩනය වැඩි වීමත් සමඟ අඟුරු නිෂ්පාදනය "මුදල් බෝගයක්" බවට පත්විය. එය වනාන්තර විනාශයටත් පාංශු ඛාදනයටත් හේතු විය. මෙමඟින් කෘෂිකර්මාන්තයට මෙන්ම ධීවර කර්මාන්තයටද හානි සිදුව ඇත. මන්ද අධික වර්ෂාපතනයත් සමඟ එහි ජලය මඩ සහිත වී මසුන් මියැදෙන බැවිනි. තවත් අතෙකින් හයිටිය යනු දරුණු සුළි කුණාටුවලට පවා ගොදුරු වන රාජ්‍යයකි.

එහි ජනගහනයෙන් 95%ක්ම කළු ජාතිකයන්ය. ඉතිරි 5% ප්‍රධාන වශයෙන් මුලාටෝ හෝ සුදු ජාතිකයින්ය. පුද්ගල ආයු අපේක්ෂාව වසර පනහකට වඩා අඩුය. ගම්බද ප්‍රදේශවල බොහෝ මිනිසුන් පෝර්ට්-ඕ-ප්‍රින්ස් අගනුවරට පලා ගොස්, මුඩුක්කු ප්‍රදේශවලට සංක්‍රමණය වන අතර, එමඟින් ඔවුන්ව පහසුවෙන්ම රෝගවලට ගොදුරු වීමේ අවදානමද මතුව ඇත. එච්.අයි.වී. ආසාදිතයින් මිලියන භාගයකට වැඩි පිරිසක් හයිටියේ සිටින බව WHO වාර්තා තුළින් පෙනේ.



එමෙන්ම හයිටියේ ජනගහනයෙන් 10%ක් පමණ ක්ෂය රෝගයෙන් පීඩා විඳී. Syphilis, Gonorrhea, වෛරස් හෙපටයිටිස්, ටයිපොයිඩ් උණ, මැලේරියාව සහ උග්‍ර පාචන රෝග ද එහි ජනතාවට දරුණු පීඩාවන් ඇතිකොට තිබේ.

1957 සිට වසර 14ක් පුරාවට හයිටිය පාලනය කළේ කුමන්ත්‍රණ සහ ආඥාදායකත්වය යොදාගනිමින්, ටොන්ටන් මැකූට් මිලීෂියාවේ සහය ඇතිව 'පපා ඩොක්' ඩුවාලියර් විසිනි. පසුව බලයට පත් ඔහුගේ පුත් 'බේබි ඩොක්' 1986 මහජන නැගිටීමකින් බලයෙන් පහ කරන ලදී. 1990 දී, විමුක්ති දේවධර්මය පිළිගත් පූජකයෙකු වූ ජීන්-බට්‍රන්ඩ් ඇරිස්ටයිඩ්, හයිටියේ ප්‍රථම නිදහස් හා සාමකාමී ජනමත විචාරණය වූ ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළේය. වසරකට පසුව ඔහුව එහි හමුදාව විසින් බලයෙන් පහ කරන ලදී.

1991 සැප්තැම්බර් කුමන්ත්‍රණයට පෙර හයිටියේ විරැකියා අනුපාතය 60%ක් විය. ජනගහනයෙන් 90%ක්ම වසරකට ඩොලර් 100කට වඩා අඩු ආදායමකින් ජීවත් වන බව ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව එහි ධනයෙන් වැඩි කොටසක් බෙදී ඇත්තේ ජනගහනයෙන් 4.5%ක් අතරය. 2021 වසර ආරම්භ වන විටත් හයිටි ජාතිකයින් මිලියන 4.4ක් ආහාර අනාරක්ෂිතභාවයෙන් පීඩා වින්දේය. උද්ධමනය හේතුවෙන් ආහාර මිල ගණන් වසරින් වසර 30%කින් පමණ ඉහළ යමින් ඇත. මෙහි අවාසනාවන්තම තත්වය වන්නේ හයිටි වැසියෙකුට එක් ආහාර වේලක් සඳහා දෛනික ආදායමෙන් 35%ක් පමණ වැය කිරීමට සිදුවීමයි. සාමාන්‍ය හයිටි වැසියෙකුගේ මාසික ආදායම, නිව්යෝර්ක්හි පුද්ගලයෙක්ගේ මාසික ආදායමෙන් දිවා ආහාර සඳහා වැය කරන මුදල් ප්‍රමාණයට සමාන වේ.

මේ අතර දෙවන හයිටි රාජ්‍ය නායකයා වූ ජනාධිපති ජීන් විල්බ්‍රන් ගුයිලූම් සෑම්ගේ කුරිරු ඝාතනයෙන් පසුව, අවුල්සහගත තත්ත්වයන් මැඩපැවැත්වීම සඳහා යැයි පවසමින් එක්සත් ජනපදය විසින් හයිටියට සිය හමුදාවන් යවන ලදී. මෙය ඔවුන්ට දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ හයිටියේ වාඩිලා ගැනීමට හේතුවක් විය. හයිටිය සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ මෙම මැදිහත්වීම මඟින් අපට මතක් කර දෙන්නේ කිඹුල් කඳුළු සැලීමකි. මන්ද යුද්ධයක් නොමැති රටක එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවක් රැඳවීමට යොදවන ලද අරමුදල් හයිටියේ සාගින්නෙන් පෙළෙන ජනතාවගේ කුසගින්න නිවාදැමීම සහ සුභසාධනය වෙනුවෙන් පහසුවෙන්ම භාවිතා කළ හැකිව තිබුණි. අද වනවිට දැඩි කුසගින්නෙන් බේරීමට මැටිවලින් සැදූ රොටි කන ජනතාවක් මෙන්ම මන්දපෝෂණයෙන් පෙළෙන ළමා පරපුරකට හයිටිය හිමිකම් කියයි.

අවසානයේ දී හයිටි වැසියන් රට හැරයාම සඳහා ඇමරිකන් තානාපති කාර්යාලය ඉදිරිපිට පොරකන දර්ශනද අද බොහෝ සේ සුලබය. ඉතාමත් විශිෂ්ට සටන්කාමී පරපුරකටත් වටිනා ස්වභාවික සම්පත්වලටත් හිමිකම් කියන හයිටි වැසියන් එහි අදූරදර්ශී නායකත්වය නිසා අද දැඩි අසරණභාවයකට පත්ව සිටී.

කෙසේ වුවද අද හයිටියට සමාන තත්වයක් ශ්‍රී ලංකාව තුළද මතු වෙමින් පවතී. අපේ රට තුළද ජාතික ආරක්ෂාව තර්ජනයට ලක්වී ඇති අතර, නිෂ්පාදනය බිඳවැටීම, නාස්තිය, වංචාව, දූෂණය, මහජන මුදල් අවභාවිතය, අවිද්‍යාත්මක සහ අවිධිමත් තීන්දු තීරණ හා පාදඩ දේශපාලන සංස්කෘතිය නිසා ආර්ථිකය විනාශ වී රට ණය බරින් මිරිකෙමින් තිබේ. භාණ්ඩ පෝලිම්, බඩුමිල ඉහළ යාම, ආහාර හිඟවීම, ආදායම් මාර්ග බිඳවැටීම නිසා ජනතාව විශාල පීඩාවකට පත්ව ඇත. නමුත් මෙරට පාලකයින්ගේ අත්තනෝමතික ක්‍රියාකලාපයන් හේතුවෙන් මෙම අර්බුදයද තවදුරටත් වර්ධනය වෙමින් පවතී.

එසේ නම් ශ්‍රී ලංකාවද තවත් හයිටියක් නොවන්නට ජනතාව මතද විශාල වගකීමක් පැවරී තිබේ. රටේ ආර්ථිකයත්, ජන ජීවිතයත් වනසා දමමින් සිටින සියලු පාලක කණ්ඩායම්වලින් මිදී, නැවත නැවතත් රැවටීමට ඉඩ නොතබමින් නව දේශපාලන ගමනක් සඳහා පෙළගැසීමට කාලය එළැඹ තිබේ. එය වසර 74ක් පුරා රැවටීමට මෙන්ම පීඩාවට පත්වූ ශ්‍රී ලාංකික අප සැමගේ වගකීමයි. එහි ප්‍රමුඛ කාර්යභාරය වත්මන් තරුණ පරපුර සතුය. එන්න, නැගීසිටින්න! එවිට නව ලොවක අරුණලු උදාවක හිමිකරුවන් වීමට අපට හැකිවනු ඇති!



# ආගම බිහිවීම-10 කොටස

පසුගිය කලාපයෙන් අප ඔබ වෙත ගෙන එනු ලැබුවේ මහමත්තුමාගේ ජීවිතය හා ඉගැන්වීම් පිළිබඳව ය. මෙවර කලාපය ජිහාඩ් සහ ඒකදේවවාදය පිළිබඳවයි.



## ජිහාඩ් සහ ඒකදේවවාදය

ඉස්ලාම් ආගමේ ඉගැන්වීම් කිහිපයක් ඇති අතර ඔවුන් කරනා බොහෝ දෑ ජිහාඩය තුළ අන්තර්ගත වී ඇත. ජිහාඩය පිළිබඳ නොයෙකුත් දෙනා නොයෙකුත් අර්ථකථන ඉදිරිපත් කර ඇත. ජිහාඩය යනු අරාබි වචනයක් වන අතර එහි තේරුම වනුයේ ප්‍රයත්නය, වෑයම, උත්සාහය වේ. නමුත් ඉස්ලාමයේදී ජිහාඩ් යනු හුදෙක් ප්‍රයත්නය යන අර්ථය පමණක් නොව දෙවියන් හෙවත් අල්ලාගේ තෘප්තිය සඳහා කරන්නා වූ නැමදුමක් ලෙස හැඳින්වෙයි. ඒ අනුව අල්ලාගේ තෘප්තිය උදෙසා කරන්නා වූ සියලු කටයුතු ජිහාඩ් නම් වේ. තවත් අතකින් "පීඩාකාරී, හිංසාකාරී හෝ දුෂ්කරතාවයන් මැද වුවද ඉස්ලාම් දහමේ නියමයන්ට පටහැනි නොවී යුක්තිය ස්ථාපිත කිරීම සඳහා වූ කරන්නාවූ" ලෙස විග්‍රහ කළ හැක. ඉස්ලාම් ආගම වෙනුවෙන් මරාගෙන මැරෙන්නන් පවා විශ්වාස කරනුයේ එය ජිහාඩ් ක්‍රියාවක් බවයි. ජිහාඩ්හි ප්‍රභේද කිහිපයක් ඉස්ලාම් විද්වතුන් විසින් විස්තර කර ඇතත් බහුතර මතය අනුව එහි ප්‍රභේද 5ක් ඇත.

**චෛතසිකයන් කරන්නා වූ ජිහාඩය (ජිහාඩ්බ බින් නෆ්ස්රකලබ්)**

**දිව උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාඩය (ජිහාඩ් බින් ලිසාන්)**

**දැනුම උපයෝගී කරගන්නා වූ ජිහාඩය (ජිහාඩ් බින් කලම්රුඉල්ම්)**

**පෑන් උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාඩය (ජිහාඩ් බින් බලම්)**

**දෑත උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාඩය (ජිහාඩ් බින් යද්)**

ඉස්ලාම් මූලධර්මවාදීන් විසින් ඉස්ලාමිකයන් නොවන්නන් මරාදැමීම සඳහා බොහෝවිට මෙම ජිහාඩය සහ කුරාණයේ සමහර පාඨ යොදාගන්නා අතර එම පාඨ පහත දැක්වේ.

"මුස්ලිම්වරුනි, අල්ලා සහ ඉස්ලාමය හැර අනෙකුත් සියලුම ආගම් සහ ඇදහීම් භූමියෙන් විනාශ කොට අතුගා දමන තුරු සහ එකම ආගම ඉස්ලාමය පමණක් වන තුරු ඔවුන්ට විරුද්ධව භීෂණය කර කෝලහාල සටහන් කරන්න" (අපි කුරාන් 2-193)

"ජිහාඩය යනු අල්ලාගෙ අරමුණ ඉටුකිරීම උදෙසා මුස්ලිම් නොවන ජන සමූහයාට විරුද්ධව කරන්නා වූ ශුද්ධ වූ සටනයි. එය සියලුම මුස්ලිම්වරුන්ට අනිවාර්යය දෙයක් ලෙස නියම කොට ඇත. එය ඔබ අකමැති වුවද එය ඔබට අනිවාර්ය කොට ඇත." (අල් කුරාන් 2-216)

"අල්ලා සහ ඔහුගේ නියෝජිතයාට එරෙහිවීම සහ අල්ලා සහ ඉස්ලාමය හැර වෙනත් දෙවියකු හෝ ආගමක් ඇදහීමට යන පාපකර්මයට නියම කොට ඇති වන්දිය වන්නේ ඔහුව මරාදැමීම හෝ කුරුසෙ තබා ඇණ ගැසීම හෝ ඔවුන්ගේ එක් පැත්තක අතකුත් ඊට විරුද්ධ පැත්තෙ කකුලකුත් කපා දැමීම හෝ භූමියෙන් එළවා දැමීමයි. මෙම දඬුවම තුළින් මුස්ලිම් ආගම හැර වෙනත් ආගම් අදහන්නන් මෙලොවදීම අවඥාවට පත් කළ යුතුය." (අල් කුරාන්-533)

"ශුද්ධ වූ මාස 4 පසු වූ වහාම පිළිම වන්දනාකරුවන්ව දුටු තැන කපාකොටා ඝාතනය කරන්න. එසේම ඔවුන් අල්ලා බැඳ දමන්න. ඔවුන් යන එන තැන්වල මග රැක සිට පහරදෙන්න. එවිට එම භීෂණය පීඩාවට පත් වී ඔවුන් තමන්ගේ ආගම අතහැර අල්ලාගේ ආගම අදහන්නට කැමති වන්නේ නම් එවැනි අයව පමණක් තෝරා මුදාහරින්න. අන් සියලුම දෙනා ඝාතනය කරන්න. අල්ලා සමාව දෙන්නාය. මහා කාරුණිකය." ( අල් කුරාන් 9-5)

ඒක දේවවාදය යනු එක දෙවියෙකු පමණක් සිටින බවත් දෙවියන්ගේ නියෝජිතයා හෙවත් ශාස්තෘවරයා තමා බවත් මහම්මත් කියා සිටියේය. මහම්මත්ගේ ධර්මය අනුව මනුෂ්‍යයා සම්බන්ධ දෙවියන් වහන්සේගේ ප්‍රාර්ථනා ප්‍රකාශ කරනු ලබන්නේ ශාස්තෘවරුන්ගේ මාර්ග යෙනි. එකම දෙවියන් වූ අල්ලාගේ අන්තිම ශාස්තෘවරයා මහම්මත් බවද, ඔහුගේ දේශනාවේ කියැවිණ. ඔහු ප්‍රතිමා වන්දනාව හෙළා දුටුවේය. අල්ලා දෙවියන්ගේ ආශිර්වාදය නොමැතිව මරණයෙන් පසුව කිසිවකුටත් සදාකාලික ස්වර්ගයට ඇතුළු විය නොහැකි බව දේශනා කළ ඔහු සර්වබලධාරී වුද අනුකම්පා සහගත වුද අල්ලා දෙවියන්ට පමණක් යටත් වන ලෙස සිය අනුගාමිකයන්ට අනුශාසනා කළේය. අල්ලා දෙවියන් කෙරෙහි විශ්වාස නොතබන අයට මරණින් පසු අපායේ දුක්විඳීමට සිදුවන බවත්, එම දෙවියන් කෙරෙහි විශ්වාසය තබන්නා වූද, එතුමාට අවනත වන්නා වූද සියලුදෙනා සහෝදරත්වයෙන් ජීවත් විය යුතු බවත් පැවසීය. මහම්මත්ගේ ඉගැන්වීම් අනුව දෙවියන් ඉදිරියේ සියලු මනුස්සයෝ එක හා සමාන වන්නේය.

මහම්මත්ගේ ආගම සරල ඒකදේවවාදයක් විය. මනුෂ්‍යත්වය පිළිබඳව හා ලෝකය පිළිබඳව ඔහුගේ ඇත්තේ අසංකීර්ණ පැහැදිලි කිරීමකි. නෙලන ලද ප්‍රතිමා, පිළිම නොහැදිය යුතුයි යයි තහනම් කරන ලදී. මධ්‍යසාර තහනම් කළේය. ලෝකයේ හැකි පමණ විශාල කොටසක් ඉස්ලාම් භක්තිකයන් වෙනුවෙන් දිනාගැනීම බැතිමතුන්ගේ යුතුකම වේ. එහෙත් කුරාණේ සඳහන් පරිදි "ග්‍රන්ථයෙ වර්ගයා" වන එනම් ශුද්ධ ලියවිල්ලකින් උගන්වන දේ අනුගමනය කරන පුද්ගලයන් වන ක්‍රිස්තියානි, යුදෙව්වන් හා ශරථුෂ්ත්‍රවාදීන්ව වද බන්ධනයට ලක් කළ යුතු නැත.

බොහෝ ඉස්ලාම් ඉගැන්වීම් තුළ ඇත්තේ ඉස්ලාම් භක්තිකයන්ට එකතු වී සමගිව ජීවත්වීමට අවශ්‍ය පරිසරයක් වන අතර එහිදී ඔවුන් කුරාණයේ ඇති සමහර ඉගැන්වීම් තුළින් මුස්ලිම් ආගම හැර වෙනත් ආගම් අදහන්නන් විනාශ කළ යුතු බවට සඳහන් කර ඇත. එසේම එම කාලය වන විට අරාබි අර්ධද්වීපය තුළ සිටි ක්‍රිස්තියානි, යුදෙව් සහ ශරථුෂ්ත්‍රවාදීන් වද බන්ධනයට ලක් නොකළ යුතු බවද සඳහන් කරයි. පොදුවේ බැලූ විට එම කාලය වන විට අරාබි අර්ධද්වීපයේ සිටි ජනයා මෙම ආගම් තුන තුළ අන්තර්ගතවී ඇත. නූතනයේ සිටින මූලධර්මවාදීන්ට අවශ්‍ය කරුණු මෙහි අන්තර්ගත නැති බවත් නූතන මූලධර්මවාදීන් කුරාණයේ ඇති මෙම ඉගැන්වීම් උපයෝගී කරගන්නේ තම මූලධර්මවාදය වර්ධනය කර අනෙකුත් ආගමිකයින් ඝාතනය සහ විනාශ කිරීමටය. අප බොහෝවිට සිතිය යුතු වන්නේ පවතින තත්වයන් හා සමාජ තත්වයන් මත එම කරුණු සිදුවූ බවය.

# සමාජ සංවර්ධනය යථාර්ථයක්ද ?




අන් කවරදාටත් වඩා අද වන විට ධනවාදී සමාජයේ අර්බුදයත් අසමත්කමත් ලංකාවේ පමණක් නොව ලෝක පරිමාණයෙන්ම සනාථ වෙමින් තිබේ. ධනවාදයේ මෙම අසමත්කම සහ අර්බුදය පිළිගැනීමට සිදු වුවද ඒ සඳහා විසඳුම ලෙස ඉදිරිපත් කරනු ලබන සමාජවාදය හා කොමියුනිස්ට් සමාජය පිළිබඳව බොහෝ දෙනෙකුට ඇත්තේ සැකයකි. අවිශ්වාසයකි. ඇතැමෙකුට එය මනෝරාජික අදහසකි. තවකෙකුට එය යහපත් නමුත් ප්‍රායෝගික නොවන යථාර්ථයක් කරගත නොහැකි සංකල්පයකි. කෙසේ වුවද සමාජ සංවර්ධනය පිළිබඳ මාක්ස් ඉදිරිපත් කළ න්‍යාය මගින් මේ සඳහා තර්කානුකූල කරුණු දැක්වීමක් කර ඇත.

සමාජය ආපස්සට ගමන් නොකරන බවත්, ඉතිහාසයේ රෝදය ආපසු කරකැවිය නොහැකි බවත්, මාක්ස්වාදය තුළින් අවධාරණය කෙරෙයි. ධනවාදී චින්තනයට අනුව ඉතිහාසය යනු සිදුවීම්වල එකතුවකි. එකම දේ යළි යළිත් සිදුවන බව සලකනු ලබයි. පාරභෞතිකවාදී චින්තනයට අනුව ද සමාජයේ ගමන් මග චක්‍රීය එකකි, එය එක තැනක කරකැවේ. "ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂත්වය දෙවරක් ඇති වන බව කිව හැක" යැයි හෙගල් වරක් පැවසී ය. හෙගල්ගේ මෙම අදහසට මාක්ස් විසින් ඌන පූර්ණයක් කරමින් මෙසේ පවසා ඇත. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය. " ඒවා ඇති වන්නේ ප්‍රථම වරට ඛේදජනක ලෙසත් දෙවැනි වර හාස්‍යජනක ලෙසත්ය."

එනම් ඉතිහාසය තුළ එකම දේ යළි යළි සිදුවන්නේ නැත. සමාන සිදුවීම් සේ පෙනුනද සැබැවින්ම සිදුවන්නේ නව තත්ත්වයන් තුළ වෙනස්කම් සහිතවය. පොදුවේ ගත් විට සමාජය ගමන් කරන්නේ ඉදිරියටය. එය සරල තත්වයේ සිට සංකීර්ණ තත්වය දක්වා ද ම්ලේච්ඡත්වයේ සිට සභ්‍ය සමාජය දක්වා ද නොදැනුමේ සිට දැනුම දක්වා ද අවිද්‍යාවේ සිට විද්‍යාව දක්වා ද වන ආකාරයට ඉදිරියට ගමන් කරයි. ඒ අනුව සමාජයේ ගමන් මග ප්‍රගතිගාමීය. එය නතර කිරීමට හෝ ආපසු හැරවීමට හෝ කිසිවෙකුටත් නොහැකිය. වහලුන්ව කෙතරම් මර්දනය කළ ද රෝමයේ පාලකයන්ට වහල් ක්‍රමය සදාකාලිකව තබා ගැනීමට නොහැකි විය. ප්‍රංශයේ ලුවී රජුටත් රුසියාවේ සාර් රජුටත් වැඩවසම් ක්‍රමය සදාකල්හි තබා ගැනීමට නොහැකි විය.

සමාජයේ චලිතයන් සිදුවන්නේ සරල රේඛීයව නොවන අතර එය සර්පිලාකාරව වර්ධනය වන්නකි. සමාජයේ වර්ධනයන් සේම පසුබෑම් ද තිබේ. ජයග්‍රහණයන් සේම පරාජයන් ද තිබේ. මේ සර්පිලාකාර වර්ධනය මාක්ස්වාදය තුළ හඳුන්වන්නේ තමන් ආරම්භ කළ තැනට ආපසු පැමිණීමට මෙන් පෙනෙන එහෙත් කිසිදා සිටි තැනට නොපැමිණෙන වර්ධනයක් ලෙසටයි. අපට ඉතිහාසයේ අඳුරු කාල පරිච්ඡේද හමුවන්නේ මේ නිසාය. සමාජය ආපසු ගමන් කරන සේ පෙනෙන්නේ ද මේ නිසාය. එක් නිෂ්පාදන මාදිලියක් අභාවයට යවමින් නව මාදිලියකට නව යුගයකට උපත දෙමින් හා පසුව ඒවා ද අභාවයට යවා නවතම සමාජ රටාවකට උපත දෙමින් සමාජය අඛණ්ඩව ඉදිරියට ගමන් කරයි.

සමාජ සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රධාන දයලෙක්තික සම්බන්ධතාවය වන්නේ මිනිස් සමාජය සහ සොබාදහම අතර වන නොනවතින අන්තර් සබඳතාවය හා ක්‍රියාකාරීත්වයයි. නමුත් සමාජය තුළ දේපළ මත පන්ති බිහිවූ පසු මෙම දයලෙක්තික සම්බන්ධය යට ගොස් ඒ වෙනුවට පංති ප්‍රතිවිරෝධය පෙරට එනු ලැබිණි. ඒ අනුව පන්ති සමාජය තුළදී සමාජ සංවර්ධනයේ දයලෙක්තික සම්බන්ධතාවය ඇතිවන්නේ නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සබඳතා අතරය. මෙහි නිෂ්පාදන බලවේග වනුයේ ශ්‍රමය හා ශ්‍රම උපකරණයි. නිෂ්පාදන සබඳතා ලෙස හඳුනාගත හැක්කේ නිශ්චිත සමාජ ක්‍රමයක් තුළ නිපදවීම බෙදාහැරීම හා පාරිභෝජනය යන ක්‍රියාවලියේ දී මිනිසුන් මිනිසුන් අතර ගොඩනැගෙන ඇසට නොපෙනෙන සම්බන්ධතාවයයි. මෙහිදී නිෂ්පාදන සබඳතා නිෂ්පාදන බලවේගයන්ට බාධාකාරී වන විට මේ දෙක අතර අතුරු ප්‍රතිරෝධයක් හටගනී. පන්ති සමාජයකදී පන්ති සටන ලෙස ප්‍රකාශයට පත් වන්නේ එයයි. මෙම ක්‍රියාවලියේදී එක් මොහොතකදී තමන්ගේ වර්ධනයට බාධා කරන විලංගු බවට පත්ව ඇති නිෂ්පාදන සබඳතා පුපුරුවා හැර නව සබඳතා ගොඩනගා ගනී. සමාජ විප්ලවය ලෙස හඳුන්වන්නේ මෙයයි.

වත්මන් ධනවාදී සමාජ ක්‍රමය තුළ මුළු ලෝකය පුරාමත් ලංකාව තුළත් නිෂ්පාදනය සමාජීය ක්‍රියාවලියක් වන අතර එහි ඵලය අත්පත් කරගැනීම පෞද්ගලිකව සිදුවීමත් සමඟ දැවැන්ත ප්‍රතිවිරෝධයක් මුළු මහත් සමාජය පුරා ගොඩනැගී තිබේ. පවතින ධනේශ්වර සබඳතා පුපුරුවා හැර නව සබඳතාවක් ගොඩනැගීමට අවශ්‍ය විෂයමූල තත්වයන් ලෝකය පුරාත් ලංකාව තුළත් සම්පූර්ණ වෙමින් තිබේ.

සමාජ සංවර්ධනය යථාර්ථයක් වන අතර මෙම ධනේශ්වර සමාජය තුළත් එම සමාජ සංවර්ධනයට අවශ්‍ය විෂයමූල වටපිටාවන් වේගයෙන් නිර්මාණය වෙමින් පවතී. මෙම ධනේශ්වර සම්බන්ධතාවය පුපුරුවා හැරීමෙන් පසුව නව මානව හිතවාදී නිෂ්පාදන මාදිලියක් නිර්මාණය කරගත යුතුය. එය සමාජවාදී නිෂ්පාදන මාදිලියක් විය යුතු අතර එහි දිගුවක් ලෙස කොමියුනිස්ට් සමාජය නිර්මාණය කිරීම අත්‍යාවශ්‍යය.



# චිලිය කැළඹූ ගැටවරයා ගබ්‍රියෙල් බොරික්...

හිටපු ක්‍රියාකාරී ශිෂ්‍ය නායක ගබ්‍රියෙල් බොරික් ඓතිහාසික ජයග්‍රහණයක් ලබමින්, චිලී රාජ්‍යයේ ලාබාලතම ජනාධිපතිවරයා ලෙස තේරී පත්ව ඇත. හේ චිලියේ වාමාංශික දේශපාලන කණ්ඩායමෙන් ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකත්වය දිනාගත් අවස්ථාවේදී තම ජනතාවට නිර්භීත ප්‍රතිඥාවක් ලබා දුන්නේය. "චිලිය නව ලිබරල්වාදයේ තොටිල්ල වුණා නම්, එය එහි සොහොන ද වනු ඇත." "චිලිය වෙනස් කිරීමට කැමති තරුණයින්ට බිය නොවන්න" යැයි ඔහු පැවසීය.

ජයග්‍රහණයෙන් පසු බොරික් සිය මංගල කතාව අරඹමින් මෙසේද පැවසීය. "පොදු ජන ජීවිතයෙන් මතුවූ පරම්පරාවක් හැටියට අපි ඉල්ලන්නෙ අපේ අයිතිවාසිකම්, ඒ වාගේම ඒවා අයිතිවාසිකම් මිසක්, පාරිභෝගික භාණ්ඩ හෝ ඔබේ ව්‍යාපාරයක් නොවන බවත් මතක තියාගන්න. ඒ වාගේම, අපි තවදුරටත් චිලියේ ඇති නැති විෂමතාවයේ මිල දිගටම දුප්පතුන්ට ගෙවන්නට ඉඩ නොතියමු." ඒ ජයග්‍රාහී රාත්‍රියේ චිලියේ අගනුවර, සාන්තියාගෝ නුවර වීදි, ලක්ෂ ගණනක් වූ අමන්දානන්දයෙන් පිරි මිනිසුන්ගෙන් පිරී ඉතිරී තිබිණි.

බොරික් ශිෂ්‍ය නායකයෙකු ලෙස ජනතාව අතර ප්‍රසිද්ධ වූයේ, සාමාන්‍ය මිනිසෙකුට දැරිය හැකි මිලකට දියුණු හා නවීන අධ්‍යාපනයක් ඉල්ලා මීට දශකයකට පමණ පෙර පැවැත්වුණු මහජන පෙළපාළි මෙහෙයවීමෙනි. එහිදී එවකට පැවති ආණ්ඩුව විසින් චිලී වැසියන් දස දෙනෙකු ඝාතනය කෙරිණි. එකල ඔහු නීති ශිෂ්‍යයෙකු වුවද පසුව දේශපාලනය වෙනුවෙන් සිය උපාධිය පවා අත්හළේය. චිලියානු ශිෂ්‍ය සටන්වල ඔහුගේ සටන් පාඨය රැව් පිළිරැව් දුන්නේ "නොහැකි දේ කරමු!" ලෙසිනි.

චිලිය ලෝකයේ විශාලතම ආදායම් පරතරය ඇති රටකි. එක්සත් ජාතීන්ගේ ඒජන්සියට අනුව එහි ජනගහනයෙන් 1% ට රටේ ධනයෙන් 25%ක් හිමිය. එරට ජනතාවට අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවය සඳහා සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ගෙවීමට සිදුව තිබේ. ජනතාව දැඩි ලෙස ණයගැති භාවයටද පත්ව සිටී. විශ්‍රාම වැටුප් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන්නේ ජනතාවගේ පෞද්ගලික ඉතිරිකිරීම් මතය.

ඔහු 2014 දී කොන්ග්‍රසයට තේරී පත් වූ විට එහි සාම්ප්‍රදායික ඇඳුම සහ ටයි පටියෙන් වැළකී සිටි අතර ඒ වෙනුවට රොක් බෑන්ඩ් පැළඳ, ටී-ෂර්ට් එකක් හා ඩෙනිම් කලිසමකින් සැරසී සිටීම චිලී පාර්ලිමේන්තුව තුළ සිටි සාම්ප්‍රදායිකවාදීන්ගේ කෝපයට හේතු විය. තමා ටයි කෝට් ඇඳ පැළඳ නොසිටින්නේ මන්දැයි යන්න පිළිබඳව එකල ඔහු මෙසේ පැවසීය. "එය පහත් යැයි සැලකෙන මිනිසුන්ගෙන් වෙන්කර හඳුනා ගැනීමට යොදාගත් ප්‍රභූන්ගේ මෙවලමක්. එකී සම්මුතීන් මම ප්‍රතික්ෂේප කරමි. මට කිසිවෙකුටත් අඩු සැලකිල්ලක් දැක්විය නොහැක."

නව චිලියානු ජනාධිපති බොරික්ගේ එක් අතක පච්චයකි. එහි කැටයම් කළ හිස්බව තුළ බැබළෙන හා උසැති ප්‍රදීපාගාරයකි. ප්‍රදීපාගාරය දකුණු පැටගෝනියාවේ කුණාටු සහිත මැගලන් සමුද්‍ර සංධියේ පිහිටියකි. බොරික් 2018 දී සමාජ මාධ්‍ය සටහනක ඒ ගැන මෙසේ ලිවීය. "ගොන්ගෝරාගේ, මම දවසක එහි ජීවත් වීමට යනවා. නමුත් ඒ අතරතුර එය මා සමඟ ජීවත් වේ." සුවිශේෂීතම දේ වන්නේ මේ මිනිසා අසීමිත ලෙස කවියට ද ආදරය කරන ජනාධිපතිවරයෙක් වීමය.

ගබ්‍රියෙල් චිලියේ කොමියුනිස්ට් පක්ෂයද ඇතුළත් "අභිමානය" නැමැති සන්ධානයේ අපේක්ෂකයා විය. එය කොමියුනිස්ට් මූලධර්මය ගැන සැකයෙන් බලන බොහෝ ඡන්දදායකයින්ට යම් අපහසුතාවයක් ගෙන ආවද, අවසානයේදී ඡන්ද ප්‍රතිඵල කැරකී තිබුණේ මේ තරුණ නායකයාගේ ජයග්‍රහණය වටාය.

කෙසේ වුවද බොරික්ගේ ප්‍රතිවාදියා වූ අන්ත දක්ෂිණාංශික ජෝස් ඇන්ටෝනියෝ කැස්ට් විසින් එදින රාත්‍රියේදීම පරාජය පිළිගත්තේ සමස්ත ඡන්දවලින් 70%ක් ප්‍රකාශ කර අවසන් වන විට ගබ්‍රියෙල් බොරික් ඡන්ද සටනේ තමාට වඩා සැලකිය යුතු තරමකින් ඉදිරියෙන් සිටින විටය. වෙනස බලාපොරොත්තු වූවාට වඩා බෙහෙවින් වැඩි විය. ආජන්ටිනාවේ හිටපු චාන්සලර් ෆෙලිපේ සෝලා විසින්ද සමාජ මාධ්‍ය ඔස්සේ මෙසේ ලිවීය. "බොරික්ගේ සහ චිලියේ ජයග්‍රහණය එරට වසර ගණනාවක් තිස්සේ සිදුවෙමින් පවතින දේශපාලන පරිවර්තනයක ප්‍රතිඵලයකි. එසේම එය සමස්ත කලාපයටම බලපාන ඉතා ධනාත්මක ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. තේරීපත් වූ ජනාධිපතිවරයාට සුබ පැතුම්."

මේ අතර සිය ජයග්‍රාහී කතාවේදී බොරික් පැවසුයේ "අපගේ පුරවැසියන්ට වඩාත් හොඳ ජීවිතයක් ගත කිරීමට හැකි වන පරිදි අපි අපේ ක්‍රියාමාර්ග තෝරන්නෙමු" යනුවෙනි. තවද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව විකාශනය වූ එක්තරා සංවාදයකදී ද නව නායකයා විසින් වරක් ජනාධිපති සෙබස්තියන් පිනේරාට පැවසූ දෙයක් නැවත නැවතත් මතක් කළේය. එනම් "රාජ්‍යයේ සියලු ගිවිසුම් සියලුම චිලී ජාතිකයන් වෙනුවෙන් විය යුතු බවත් වසා දැමූ දොරවල් නැවතත් සැඟවී හෝ ඇති කර නොගත යුතු" බවත්ය.

ඉඳින් මේ විප්ලවකාරී තරුණ කොලුගැටයා විසින් චිලියත්, ලතින් ඇමරිකානු කලාපයත් ආලෝකමත් කරනු ඇතැයි ලොව පුරා වෙසෙන වාමාංශික සහ ප්‍රගතිශීලී සියලු දෙනා දෑස් දල්වා බලා සිටිනු නිසැකය. ඔව්...! බොරික්...!! නොහැකි දේ කිරීමට ඔබට දැන් හැකියි සහෝදරයා...!!!

] උපාලි ජයසිංහ [

කරක් ගහපු තැනක්



# ලූල්කඳුරට සෙවණ සැලසූ කොණ්ඩගල

යටත්විජිත සමය කියන්නෙ ලංකාව විපර්යාසයකට මුහුණ දුන්න කාලයක් කියලා කිව්වොත් නිවැරදියි. ඒ කාලෙ ලංකාව අපනයන ආර්ථිකයකට යොමු කරවපු වගාවක් ඇරඹී ප්‍රදේශයක කළ සංචාරයක් ගැනයි මේ කියන්න යන්නෙ.

අපේ අරමුණ ලූල්කඳුර වතුයාය නරඹා කොණ්ඩගල කන්ද තරණය කිරීමයි. මහනුවරින් දෙල්තොට නගරයට ඇවිල්ල ලූල්කඳුර වතුයායට පිවිසෙන්න පුළුවන්. ලූල්කඳුර කියන්නෙ මහනුවර සහ නුවරඑළිය වෙන් කරන සීමාව කියලයි හඳුනා ගන්නේ.

ලූල්කඳුර අපට වැදගත් වන්නේ ලංකාවේ පළමු වාණිජ තේ වතුයාය නිසයි. තේ වත්තට ඇතුළුවන පිවිසුමේ ඉඳලා කිලෝමීටර කිහිපයක් දුරින් පිහිටි සුවිශේෂී ස්ථානයකට ළඟා වෙන්න පුළුවන්. ජේම්ස් ටේලර්ගෙ සැමරුම් තවමත් නිහඬවම අතීතයක සාක්ෂි දරාගෙන ඉන්නවා. ජේම්ස් ටේලර්ගෙ බංගලාව තිබුණ ස්ථානයේ දැනට ඉතිරි වෙලා තියෙන්නෙ උඳුන සමඟින් දුම් කවුළුව විතරයි. ඊට අමතරව ඔහු භාවිතා කළා යැයි සැලකෙන ළිඳක් ද "ටේලර් සීට්" ලෙසින් නම් දරා ඇති ආසනයක් ද වෙනවා. හොඳින් දර්ශනය වන කොණ්ඩගල පර්වතය තියුණු ගල් බිත්තියක සිරි ගන්වනවා.

අනතුරුව කඳු මුදුන කරා දිවෙන මාර්ගයට පිවිසෙන්න පුළුවන්. අඩි පාර අවසාන වනවාත් සමගම හමුවන්නේ තරමක සෘජු ගල් පර්වතයක්. අසීරු බවක් පෙනුනත් එය තරණය කිරීම එතරම් අසීරු කාර්යයක් නම් නෙමෙයි. විනාඩි කිහිපයක ගමනින් කන්ද මුදුනට ළඟා වෙන්න අපට පුළුවන් වුණා.

ගල් තලා කිහිපයකින් සමන්විත කඳු මුදුන මීටර් දෙසීයක් පමණ දිගකින් යුක්තව පුළුල්ව විහිදෙනවා. ගල් තලාවේ ඇතැම් ස්ථාන තෘණ ශාකවලින් වසාගෙන. කොණ්ඩගල පර්වතයේ සංචාරක ආකර්ෂණය වඩාත්ම දිනා ගන්නා ස්ථානය නම් ගල් තලාවෙන් ඉදිරියට නෙරාගොස් අවකාශයට විවෘත වන කොටසයි. මේ ගල් ආසනය මත සිට ඡායාරූප ගැනීමට බොහෝ දෙනා ප්‍රිය කරනවා.

එක් පසෙක වූ සෘජු ප්‍රපාතය නිසා කොණ්ඩගල යනු තරමක භයානක ස්ථානයක් කියලත් හඳුන්වන්න පුළුවන්. ඒ වගේම සුළඟ තරමක් සැර නිසා ප්‍රවේසම් වීම නුවණට හුරුයි.

විශාල වපසරියක් දක්නට ලැබෙන නිසාත් අඩු කාලයකින් තරණය කරන්න පුළුවන් නිසාත් කොණ්ඩගල ලංකාවේ කඳු තරණය කරන්නන් අතර ජනප්‍රියතම ස්ථානයක් කිව්වොත් නිවැරදියි. ඔබත් කොණ්ඩගල තරණය කරනවනම් පරිසරයට හානියක් නොකර ඒමට වගබලා ගන්න.



] ගයාන් තුදුස්ක [

# පිපිරෙන ගෑස් ප්‍රශ්නය පාරිභෝගික අධිකාරියට



ගෑස් පාරිභෝගිකයින් මුහුණ දී සිටින ගෑස් අර්බුදය පිළිබඳව පැමිණිල්ලක් පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත සමාජවාදී තරුණ සංගමය විසින් පසුගිය දෙසැම්බර් 21 වන දින භාර දුනි.

පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපලවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරාක්ෂා කිරීම, අසාධාරණ වෙළඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම, අසාධාරණ වෙළඳ පිළිවෙත්, සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයක් ලබා දීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ අදාල පියවර ගත යුතු වග පැමිණිල්ල හරහා පාරිභෝගික අධිකාරිය වෙත දැනුම් දුනි.

එම අවස්ථාව සදහා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන අමරසිංහ සහෝදරයා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# පර්ල් නැවේ විනාශය ගැන සාකච්ඡාවක්...



එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ඇති වූ පාරිසරික හානියත් ඊට වගකිව යුතු පාර්ශ්වයන්ගේ වගකීම් රහිත හැසිරීමත් මෙන්ම පාරිසරික හානිය සහ ධීවර ප්‍රජාවට සිදුව ඇති හානියේ අලාභයත් පිළිබඳව ලිපියක් SYU මඟින් 2021.11.19 දින වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත බාර දුනි. ඒ සම්බන්ධයෙන් වන සාකච්ඡාවක් දෙසැම්බර් 15 වන දින අමාත්‍යාංශය විසින් සමාජවාදී තරුණ සංගමය වෙත ලබා දී තිබුණි.

# IYFSWS ජාත්‍යන්තර තරුණ සමුළුව ස්පාඤ්ඤයේදී



ස්පාඤ්ඤයේ මලගාහි පැවැත්විණි. ඒ නොවැම්බර් 26 සිට 28 දක්වායි. IYFSWS ඒ සඳහා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් ප්‍රදීප් ලසන්ත සහ චමින්ද ජයරත්න යන සහෝදරවරු සම්බන්ධ වූහ. එහිදී මොරොක්කෝවේ දීර්ඝකාලීන බලහත්කාරී මැදිහත්වීම, මානව හිමිකම් උල්ලංඝනය සහ සම්පත් සූරාකෑම පිළිබඳවත් බටහිර සහරාව නිදහස් සහ ස්වෛරී රටක් බවට පත්කර ගැනීම සඳහා ජාත්‍යන්තර සහය ලබාගැනීම අවධානය යොමුව තිබුණි. මේ සඳහා ලොව පුරා ප්‍රගතිශීලී සංවිධාන රැසක නියෝජිතයින් සහභාගී විය.

# සෞභාග්‍යයේ අයවැයේ සෞභාග්‍ය ගැන SYU එක අදහස් දක්වයි



සෞභාග්‍යයේ දැක්ම තුළින් ආණ්ඩුව ඉදිරිපත් කළ තෙවන අයවැය පිළිබඳව සමාජවාදී තරුණ සංගමය මාධ්‍ය ඉදිරියේ අදහස් දැක්වීය. එහිදී අදහස් දක්වමින් සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා කියා සිටියේ තරුණ ඔබට වංචා කළ දේශපාලනය වෙනස් කර රට නව මාවතකට හැරවීමට එක්විය යුතු බවයි.

මේ අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, නීතිඥ ශානිකා සිල්වා සහෝදරිය සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන අමරසිංහ සහෝදරයා සහභාගී විය.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.